ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

වී නිෂ්පාදන පිරිවැය
1972/73 මහ

දිස්ත්‍රික්ක පහක වාර්තා තබාගත් ගොවීන්ගෙන් ලබාගත්
තොරතුරු මත පදනම් වූ අධ්‍යයනයකි

කේ. ඉසුමි
ඒ. එස්. රණතුංග

පර්යේෂණ අධ්‍යයන මාලාව: අංක. 5 1974 අගෝස්තු

2009/06

2010/04

06

වී නිෂ්පාදන පිරිවැය - 1972/73 මහ

දිස්ත්‍රික්ක පහක වාර්තා තබා ගත් ගොවීන්ගෙන් ලබා ගත් තොරතුරු මත පදනම් වූ අධ්‍යයනයකි

ජේ. ඉසුමි

ඒ. එස්. රණතුංග

පර්යේෂණ අධ්‍යයන මාලාව-අංක 5

1974 ජූලි

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
තැ.පෙ. 1522
කොළඹ

22119

පුස්තකාලය
LIBRARY

22119

පටුන

		පිටු අංකය
ස්තුතිය	.. ..	III
හැඳින්වීම	.. ..	IV
සම්පිණ්ඩනය	.. ..	VIII
සටහන් ලේඛනය	.. ..	XII
I වන කොටස	- සාමාන්‍ය තොරතුරු ..	I
II වන කොටස	- කායික ශ්‍රමය, මී හරක් සහ ට්‍රැක්ටර් උපයෝගී කර ගැනීම ..	6
III වන කොටස	- අක්කරයක නිෂ්පාදන පිරිවැය ..	10
IV වන කොටස	- බුසලක නිෂ්පාදන පිරිවැය ..	18
V වන කොටස	- නිෂ්පාදන පිරිවැය සහ ඉඩම් භුක්තිය	20
VI වන කොටස	- අක්කරයක අස්වැන්න සහ බුසලක පිරිවැය අතර ඇති සම්බන්ධතාවය ..	27

උපලේඛනය I මිල කිරීමේ පිළිවෙල .. 34

උපලේඛනය II වගා පිළිවෙත් පිළිබඳ සවිස්තර සටහන් 39

උපලේඛන සටහන

I. අක්කරයක් සඳහා මෙහෙයුම් කාරක වශයෙන් ශ්‍රම ව්‍යාප්තිය මහ 1972/73 සියළුම වාර්තා තබා ගත් ගොවිපලවල සාමාන්‍ය 38

II. ගොවීන්ගේ ඉඩම් භුක්ති තත්වයන් අනුව අක්කරයක ක්ෂේත්‍ර කාර්යයන් සඳහා උපයෝගී කර ගන්නා ලද මිනිස් දින ගණන 1972/73 මහ. 35

අපේ ස්තුතිය

දත්ත එකතු කර ගැනීමේදී මහත් ඕනෑකමින් අපට ආධාර සැපයූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි ව්‍යාප්ති අංශයට අපි මහත්සේ කෘතඥ වෙමු. මෙම අධ්‍යයනය පිළිබඳව පුද්ගලික වශයෙන් උනන්දුවක් දක්වමින් අපට විවිධාකාරව උදව් කළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය ර්.අබේරත්නට අපගේ විශේෂ ස්තුතිය හිමි වෙයි.

දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි ජේ.වික්‍රමරත්න (හම්බන්තොට), බී.ප්‍රනාන්දු (පොළොන්නරුව), ර්.ඇම්.අබේරත්න (මහනුවර), පී.එස්.එන්.සී.විජේවර්ණසූරිය (කොළඹ), ඩබ්ලිව්.අබේවර්ධ (කුරුණෑගල) යන මහතුන්ට ද, විශේෂයෙන් ව්‍යාපාර කළමනාකරු ඒ.පී.කුලරත්න (ඇලහැර), ඩබ්ලිව්.රත්නායක (හිඟුරක්ගොඩ) යන මහතුන්ටද, ඉහත සඳහන් කළ දිස්ත්‍රික්කවල නිෂ්පාදන පිරිවැය වාර්තා අප වෙනුවෙන් රැස් කළ කෘෂිකර්ම උපදේශක වරුන්ටද අපගේ ස්තුතිය හිමි වෙයි. VI වෙනි කාණ්ඩයෙහි සංඛ්‍යානමය ආදර්ශය පිළිබඳව අපට උපදෙස් දීමෙන් සහ එම කාණ්ඩයෙහි සටහන් ගණනය කිරීමේදී සහයෝගය දුන් පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී (සංඛ්‍යා ලේඛන) වී.සන්මුගම් මෙනෙවියට අපගේ විශේෂ ස්තුතිය පිරි නමමු.

මෙම අධ්‍යයනය කිරීමේදී අපට නන් අයුරින් උපදෙස් දුන් සහ අප ධෛර්යමත් කළ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ සී.නාරායනසාමි සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ප්‍රධාන උපදේශක ෆ්‍රෑන්ක් සෝන්ඩර්ස් යන මහතුන්ට ද අපගේ ස්තුතිය හිමි වෙයි.

ඉතාමත් කෙටි කාලයක් තුළ මෙම අධ්‍යයනය සිංහලෙන් සකස් කර දුන් පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී යූ.එල්.ජයන්ත පෙරේරා මහතාටත්, සිංහල පිටපත සංස්කරණය කළ ප්‍රවෘත්ති/ප්‍රකාශන නිලධාරී ආරියපාල සිරිවර්ධන මහතාටත් ස්තුති කරමු.

හැ ඳි න් වී ම

ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වී නිෂ්පාදනය ඉතා වැදගත් ස්ථානයක් දරන නිසා සීමිත පදනමක් මත වුවද නිෂ්පාදන පිරිවැය දත්ත එකතු කර ගැනීම ඉතා වැදගත් වේ. වී නිෂ්පාදන යෙහි උපයෝගී කර ගන්නා ශ්‍රමය, සත්ව බලය, පොහොර සහ කෘෂිරසායනික ද්‍රව්‍ය වැනි ප්‍රධාන යෙදවුම්වල පිරිවැය පසුගිය කන්න කීපයෙහි වැඩි වූ බව කවුරුත් දන්නා කරුණකි. යෙදවුම් වල පිරිවැය වැඩි වීම නිසා වීවල සහතික මිළ ලඟදී රජය මගින් දෙවරක් සංශෝධනය කරන ලදී. මුල් අවස්ථාවේදී එනම් 1973 සැප්තැම්බර් මාසයේදී රු. 14.00 ක් වූ සහතික මිළ රු. 18.00 දක්වා වැඩි කළ අතර එම වසරේම ඔක්තෝම්බර් මාසයේදී රු. 18.00 රු. 25.00 දක්වා වැඩි කරන ලදී. 1972 සිට 1973 දක්වා වූ කාල පරිච්ඡේදයෙහි දී යෙදවුම්වල පිරිවැය ඉක්මණින් වැඩි වූ අතර ගොවීන්ට ගෙවන මිලෙහි ඍජු නැගීමක් ද පෙනේ. මෙම තත්වය යටතේ පිරිවැය ව්‍යුහයේ සහ සම්පත් උපයෝගී කර ගන්නා ආකාරයෙහි ඇති වන වෙනස්කම් පිළිබඳව නිතරම පරීක්ෂාකාරීව සිටීම ප්‍රයෝජනවත් වනු ඇත.

ගොවි වාර්තා පොත් උපයෝගී කරගෙන වී නිෂ්පාදන පිරිවැය සම්බන්ධයෙන් කතෘවරුන් විසින් පවත්වන ලද දෙවෙනි අධ්‍යයනය මෙය වේ. 1972 යල කන්නයේදී වාර්තා තබා ගැනීම හා මිල කිරීම සම්බන්ධයෙන් උපයෝගී කර ගත් **ක්‍රමය මෙම** අධ්‍යයනයේදී ද යොදා ගන්නා ලදී. හම්බන්තොට, පොළොන්නරුව, කුරුණෑගල, මහනුවර සහ කොළඹ යන දිස්ත්‍රික්කවල කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ගේ සහාය ඇතිව දත්ත එකතු කර ගන්නා ලදී.

මෙම අධ්‍යනය 1972 යල කන්නයෙහි කරන ලද අධ්‍යනය හා සසඳන කල වෙනස්කම් කිහිපයක් දක්නට ලැබේ.

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි පිහිටා ඇති ඇලහැර ජනපද යෝජනා ක්‍රමයෙන් එකතු කර ගන්නා ලද දත්ත මෙම විශ්ලේෂණයේදී වෙනමම උපයෝගී කර ගන්නා ලදී. ඇලහැර විශේෂ ව්‍යාපාරයක් වන අතර එහි සූක්ෂම කෘෂිකර්ම ව්‍යාප්ති වැඩ සටහන් පවත්වාගෙන යනු ලැබේ.

(ආ) මහනුවර දිස්ත්‍රික්කයෙහි දත්ත අදාළ වන්නේ එම දිස්ත්‍රික්කයේ තෙත් ප්‍රදේශවලට පමණි. වියළි කලාපයේ පිහිටා ඇති මිනිපේ ජනාවාස යෝජනා ක්‍රමය මෙම අධ්‍යයනයෙහිදී අත් හරින ලදී; මෙම ව්‍යාපාර ප්‍රදේශයෙන් දත්ත ලබා ගැනීමට නොහැකි වූ හෙයිනි.

(ඇ) හම්බන්තොට, කුරුණෑගල, මහනුවර සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හි එකතු කර ගන්නා ලද දත්ත කරුණු දෙකක් නිසා ගොවීන්ගේ ඉඩම් භුක්ති තත්වය මත යළිත් වර්ග කරන ලදී. එම කරුණු දෙක නම් සම්පත් භාවිතා කරන රටාව පරීක්ෂා කර දැන ගැනීම සහ ඉඩම් හිමියන් මෙන්ම අඳ ගොවීන්ගේ පිරිවැය ව්‍යුහය දැන ගැනීමය. පොළොන්නරුව සහ

ඇලහැර ප්‍රදේශවල වාරිතා තබා ගත් ගොවීන් ජනපද යෝජනා ක්‍රමයන්ට අයත් ඉඩම් හිමි ගොවියන් නිසා එම ප්‍රදේශවල එකතු කර ගන්නා ලද දත්ත මෙම විශේෂ අධ්‍යයනයෙහි V වැනි කොටසින් ඉවත් කරන ලදී.

අධ්‍යයනයෙහි පරමාර්ථ:

1. වී නිෂ්පාදනයෙහිදී යොදා ගන්නා ශ්‍රමය, සත්ව/යාන්ත්‍රික බලය සහ අන්‍ය යෙදවුම්වල ප්‍රමාණය සොයා දැන ගැනීම;

2. විවිධ කෘෂි-දේශගුණික ප්‍රදේශවල පිහිටා ඇති තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක අක්කරයක් වූ වපසරියක නිෂ්පාදන පිරිවැය සහ වී බුසලක් නිෂ්පාදනය කිරීමට යන පිරිවැය සොයා දැන ගැනීම;

3. පවුලේ ශ්‍රමය වඩාත් සූක්ෂම ලෙස උපයෝගී කර ගැනීමට ඇති ඉඩ කඩ දැන ගැනීම සඳහා මෙහෙයුම් කාරක වශයෙන් වී නිෂ්පාදනයෙහි ශ්‍රම ව්‍යාප්තිය සොයා දැන ගැනීම;

4. අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද දිස්ත්‍රික්කවල ඉඩම් භුක්ති තත්වයන් අනුව ඇති වන නිෂ්පාදන පිරිවැය වෙනස්වීම් සොයා දැන ගැනීම;

5. ගොවිපලවල වාරිතා තබා ගැනීම පිළිබඳව පුහුණුවක් සහ අත්දැකීම් ව්‍යාප්ති නිලධාරීන්ට ලබා දීම සහ ගොවිපලේහි අය වැය ඇස්තමේන්තු ආදිය පිළියෙල කිරීම ඇතුළු කෘෂිකර්ම ආර්ථික සැලසුම් පිළියෙල කිරීමෙහි ලා උපයෝගී විය හැකි යෙදවුම් සහ නිමැවුම් පිළිබඳව මූලික දත්ත ඔවුන්ට සපයා දීම.

අධ්‍යයන ක්‍රමය

1972/73 මහ කන්නයේදී හම්බන්තොට, පොළොන්නරුව, ඇලහැර, කුරුණෑගල, නුවර සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හි වී ගොවිතැන් කල ගොවීන් 114 දෙනෙක් ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය කරන ලදී. මෙම ආයතනයෙහි නිෂ්පාදන ආර්ථික අංශය මගින් පිළියෙල කරන ලද ගොවි වාරිතා පොත් අවශ්‍ය දත්ත වාරිතා කර ගැනීම සඳහා කෘෂිකර්ම උපදේශකවරුන් විසින් උපයෝගී කර ගන්නා ලදී. කලින් කරන ලද ගොවිතැන් කටයුතු පිළිබඳව ගණන් හිලව් ඉක්මණින් අමතක විය හැකි හෙයින් ගොවීන්ගේ මතකය අනුව නිවැරදි දත්ත එකතු කිරීම අසීරු නිසා මෙම ක්‍රමය අවස්ථානුකූල යයි සැලකින. මේ නිසා අවශ්‍ය දත්ත එකතු කිරීම සඳහා පරීක්ෂාව යටතේ ගොවි සටහන් පොත් භාවිතා කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කරන ලදී. වාරිතා තබා ගැනීමෙහි ඇති විස්තරාත්මක ස්වභාවය සහ තමන්ට ඉටු කිරීමට ඇති අනෙකුත් කටයුතු නිසා මෙම වැඩ සටහනට සහභාගී වීමට කෘෂිකර්ම උපදේශකවරුන්ට ලැබුණු සීමිත කාලය ගැන සලකා ඒ ඒ ප්‍රදේශ වලින් ගොවීන් සුළු ගණනක්

පමණක් තෝරා ගන්නා ලදී. පහත දැක්වෙන කරුණු මත ගොවීන් තෝරා ගන්නා ලදී.

1. කන්නය පුරාම වී නිෂ්පාදනය පිළිබඳ අදාළ තොරතුරු සැපයීමෙන් මෙවැනි ස්වභාවයේ යෝජනා ක්‍රමයකට සහයෝගය දීමට ගොවීන් දැක්වූ මනාපය.

2. කෘෂිකර්ම උපදේශකවරුන් තමන්ගේ සාමාන්‍ය රාජකාරීවලට බාධා නොවන අන්දමට මෙම ගොවීන් සමඟ නිතරම සම්බන්ධතා පවත්වා ගැනීමට ඇති ඉඩ කඩ, අධ්‍යයන කාලයේදී ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක තැන අවම වශයෙන් සතියකට දෙතුන් වරක්වත් අදාළ තොරතුරු ලබා ගැනීමට සටහන් පොත් තබා ගන්නා ගොවීන් හමු විය.

ඉක්මගිය කන්නයේදී (යල 1972) සමාන ගොවිපල සටහන් පොත් මෙන්ම මිල කිරීමේ ක්‍රමය උපයෝගී කර ගත් නිසා එම අධ්‍යයනයට සහභාගී වූ කෘෂිකර්ම උපදේශකවරුන්ට ගොවිපල වාර්තා තබා ගැනීම පිළිබඳව සෑහෙන අත්දැකීමක් තිබින. ඔවුන් පුහුණු කිරීමේ පංති පැවැත්වීම මේ නිසා අනවශ්‍ය බව පෙනින. කතඤවරු ඒ ඒ ව්‍යාපාර ප්‍රදේශවලට නිපවිටක්ම ගොස් වාර්තා තබා ගැනීමේ කාර්ය පිළිවෙළ ක්‍රමවත්ව පරීක්ෂා කර බැලූහ.

අධ්‍යයනයෙහි සීමාවන්

මුලින් සඳහන් කළ පරිදි මෙම අධ්‍යයනය මූලික වශයෙන් විවිධ කෘෂි-දේශගුණික කලාපවල පිහිටා ඇති දිස්ත්‍රික්ක පහකට පමණක් සීමා වෙයි. තෝරා ගන්නා ලද නියැදියෙහි කුඩා බවත් සහ ගොවීන් තෝරා ගැනීමේදී අනුගමනය කළ යම් යම් සීමාවන් සලකා බලන කල මෙම අධ්‍යයනයෙහි ප්‍රතිඵල පක්ෂපාදී ස්වභාවයකින් නිදහස් නොවන අතර අධ්‍යයනයෙහි ප්‍රතිඵල විවරණය කිරීම සැළකිය යුතු පරීක්ෂාකාරී බවකින් කළ යුතුය. මෙම වාර්තා වලින් ලබා ගන්නා ලද දත්ත මගින් සාමාන්‍යකරනයක් ලබා ගැනීමට අදහස් නොකැරිණ. මෙම අධ්‍යයනයෙහි ඉදිරිපත් කරන තොරතුරු ව්‍යාප්ත නිලධාරීන්ට තම උපදේශක කටයුතුවලදී ප්‍රයෝජනවත් මඟ පෙන්වීමක් කරතියි අදහස් කෙරින. තවද එම දත්ත පවුල් ගොවි ඉපයුම් වැඩි කිරීමට ඇති ඉඩ කඩ විදහා පෑමට උපයෝගී කර ගත හැක. මෙවැනි සීමාවන් තිබුණද මෙහි ප්‍රතිඵල ව්‍යාප්ති නිලධාරීන්ගේ ගොවිපල කෘෂිකාර්මික සැලසුම් කටයුතුවලදී මූලික දත්ත වශයෙන් ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීමට හැකි වනු ඇත. විවිධ කෘෂි දේශගුණික තත්වයන් සහ සම්බන්ධ සමාජ-ආර්ථික තත්වයන් ඇති ප්‍රදේශවල වී නිෂ්පාදනයෙහි ලා සම්පත් උපයෝගී කර ගන්නා රටාව පිළිබඳව යම් ආලෝකයක් මෙම අධ්‍යයනයෙන් සැපයෙතියි සිතමු. කෙසේ වෙතත්, මෙම දත්ත මිල කිරීමේ ප්‍රතිපත්තිවලදී නොසෑහෙන බව මෙහිදී සඳහන් කළ යුතුය.

නිර්වචන

මහ	-	මෙම කාල පරිච්ඡේදය සාමාන්‍යයෙන් සැප්තැම්බර්-ඔක්තෝබර් පමණ සිට පෙබරවාරි-මාර්තු දක්වා පැතිරෙන අතර වියලි කලාපයට වර්ෂාව ගෙන දෙන ඊසාන දිග මෝසම් සුළං කාලය හා සම්බන්ධය.
යල	-	මෙම කාලය සාමාන්‍යයෙන් අප්‍රේල් සිට අගෝස්තු දක්වා පවතී. තවද වියලි කලාපයට සුළු වර්ෂාවක් ලැබෙන නිරිතදිග මෝසම් කාලය ද මෙම කාලය වෙයි.
වියලි කලාපය	-	ප්‍රධාන වශයෙන් ඔක්තෝබර් සිට ජනවාරි දක්වා වන කාලයෙහි වන පරිදි අවුරුද්දකට 75" ට අඩු වර්ෂාපතනයක් ලැබෙන වියලි කොටසය.
තෙත් කලාපය	-	අවුරුද්දකට අඟල් 75 කට වඩා සාමාන්‍ය වර්ෂාපතනයක් ලබන රටෙහි තෙත් ප්‍රදේශ තේ කලාපය නමින් හැඳින්වේ. මෙම ප්‍රදේශය නිරිතදිග මෝසම් වැසි කාලයේදී තද වර්ෂාපතනයක් ලබයි.
වී වර්ග	-	පැරණි දියුණු කල වර්ග, නව දියුණු කල වර්ග සහ සම්ප්‍රදායික වර්ග ලෙස වී වර්ග තෙආකාරයකට වර්ග කොට ඇත. පැරණි දියුණු කල වී වර්ග: එච්-4, එච්-8, එච්-105. නව දියුණු කල වී වර්ග: බීජී 11-11, එල්ඩී 66, එම්අයි-273, බීජී 34-6, බීජී 34-8 සම්ප්‍රදායික වී වර්ග: නොතේරූ සාමාන්‍ය දේශීය වී වර්ග මීට ඇතුළත් වේ.
සත්ව/යාන්ත්‍රික බලය	-	මී හරක් සහ ට්‍රැක්ටර් යන්ත්‍ර බලය අදහස් වෙයි.

සම්පිණ්ඩනය

දිස්ත්‍රික්ක පහක 1972/1973 වර්ෂයේ මහ කන්නයෙහි වී නිෂ්පාදන පිරිවැය පිළිබඳ දත්ත එකතු කිරීමේ අරමුණ ඇතිව වාර්තා පොත් 114 ක් පවත්වාගෙන යන ලදී. මෙම අධ්‍යයනයට සහභාගී වූ ගොවීන්ගේ සුළු සංඛ්‍යාව සහ මූලික වශයෙන් ගොවීන් තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද යම් යම් සීමාවන් සලකා බලන කල මෙම වාර්තාවේ දක්වා ඇති දත්ත වලින් ප්‍රතිපත්ති තීරණයන් සඳහා සාමාන්‍ය නිගමනයන් ලබා ගැනීමට අදහස් නොකැරින.

වියළි කලාපයෙහි වගා කරන ලද ඉඩම් කට්ටි (වපසරිය අක්කර 4 ක් පමණ) තෙත් කලාපයෙහි ඉඩම් (අක්කර 1 ක් පමණ) හා සසඳන විට සැහෙන පමණ විශාල වේ. මෙම කන්නයේදී කුරුණෑගල සහ කොළඹ යන දිස්ත්‍රික්ක දෙක හැර අන්‍ය අධ්‍යයන ප්‍රදේශවල ජල සම්පාදනය ඉතා සතුටුදායක විය. නව දියුණු කල වී වර්ග විශේෂයෙන් වියළි කලාපයේ දිස්ත්‍රික්කවල බහුල වශයෙන් උපයෝගී කර ගත් බව දක්නට ලැබිණ. කොළඹ දිස්ත්‍රික්කය හැර අන්‍ය ප්‍රදේශවල ඉහළ අස්වැන්න ප්‍රමාණයන් වාර්තා විය. පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් අක්කරයකට බුසල් 86 ක් වාර්තා වූ අතර එම ප්‍රමාණය ප්‍රදේශ පහෙන්ම වැඩිම අස්වැන්නක් ලැබුණු දිස්ත්‍රික්කය ද විය; තවද එම අස්වැන්න ප්‍රමාණයන් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අස්වැන්නට වඩා හරියටම දෙගුණයකි.

විවිධ දිස්ත්‍රික්කවල අක්කරයක් සඳහා උපයෝගී කර ගත් මිනිස් ශ්‍රම දින ගණනෙහි සැහෙන පරිදි වෙනස්කම් දක්නට ඇත. වඩා සූක්ෂම ලෙස ශ්‍රමය උපයෝගී කරගෙන ඇත්තේ මහනුවර දිස්ත්‍රික්කයෙහිය. එම දිස්ත්‍රික්කයෙහි අක්කරයක් වගා කිරීම සඳහා මිනිස් දින 96 ක් වැය කොට ඇත. හම්බන්තොට අක්කරයකට උපයෝගී කරගෙන ඇත්තේ මිනිස් දින 52 ක් පමණි. පොළොන්නරුව, හම්බන්තොට වැනි වියළි කලාපයේ දිස්ත්‍රික්කවල උපයෝගී කර ගත් කුලී ශ්‍රම අනුපාතය ඉතා ඉහළ මට්ටමක වූ අතර එය මුළු ශ්‍රම යෙදවුමෙන් 75% කට වඩා වැඩි විය. මෙම දිස්ත්‍රික්ක දෙකේම අත්තම් ශ්‍රමය භාවිතා නොවූ තරම්ය. කොළඹ දිස්ත්‍රික්කය හැර අනික් දිස්ත්‍රික්ක හතරෙහි අක්කරයක් සඳහා අඳ ගොවීන්, ඉඩම් අයිති ගොවීන්ට වඩා වැඩි ශ්‍රම ප්‍රමාණයක් වගා කටයුතුවලට උපයෝගී කර ගත් බව පෙනේ. අඳ ගොවීහු ඉඩම් හිමි ගොවීන්ට වඩා වගා කටයුතු සම්බන්ධයෙන් පවුලේ ශ්‍රමය මත යැපුන බව පැහැදිලිය. පොළොන්නරුව සහ ඇලහැර යන දිස්ත්‍රික්ක දෙකෙහි ට්‍රැක්ටර් භාවිතය වඩා පැතිර තිබිණ. කෙසේ වෙතත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ඇලහැර ජනාවාස යෝජනා ක්‍රමයෙහි භාවිතා කරන ලද ට්‍රැක්ටර් බලය පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි අක්කරයක් සඳහා උපයෝගී කර ගත් මුළු ට්‍රැක්ටර් බලය හා සසඳන විට සැහෙන පමණ අඩු මට්ටමක පැවතින. ඇලහැර, මහනුවර සහ කොළඹ දිස්ත්‍රික්කයන්හි සත්ව/යාන්ත්‍රික බලයෙහි වැදගත්ම මූලය වූයේ මී හරක්ය.

ඇලහැර සහ පොළොන්නරුවෙහි අක්කරයකට ලැබුණු අස්වැන්න උපරිම වූ අතර නිෂ්පාදන පිරිවැය ද ඉහළ මට්ටමක විය. එම පිරිවැය අක්කරයකට රු. 734.00 සිට

රු. 765.00 දක්වා වෙනස් විය. අක්කරයකට ලැබුණු අස්වැන්න අවම වූයේ කුරුණෑගල සහ කොළඹ යන දිස්ත්‍රික්කවලය. එසේම එම ප්‍රදේශවල අක්කරයක නිෂ්පාදන පිරිවැය ද අඩු වූ අතර එම පිරිවැය රු. 625.00 ක් විය. මුළු මිල ව්‍යුහයෙහි ඉතා වැදගත්ම අයිතමය කුලී ශ්‍රමය වූ අතර විවිධ දිස්ත්‍රික්කවල මුළු පිරිවැයෙහි කුලී ශ්‍රම අනුපාතය 35% සිට 51% අතර විචලනය විය. දෙවැනි ඉතා ඉහළ වියදම් අයිතමය නම් බලය සඳහා ගෙවූ පිරිවැයයි. අධ්‍යයනයට පාත්‍ර වූ සියළු ප්‍රදේශවල මුළු නිෂ්පාදන පිරිවැයෙන් 60% කටත් වැඩි ප්‍රමාණයක් කුලී ශ්‍රමය සහ සත්ව හා යාන්ත්‍රික බලය සඳහා වියදම් වූ බව පැහැදිලි වේ. එවැනි තත්වයන් යටතේ කුලී ශ්‍රමය සහ බලය සඳහා වන වියදම් වැඩි කළවිට, මිල දී ගත යුතු අන්‍ය යෙදවුම්වල මිල වැඩි වීමකට වඩා එය ගොවීන්ට දුෂ්කරතාවන් ඇති කරන බව පෙනේ. අධ්‍යයනය කරන ලද සියළුම ප්‍රදේශවල උපරිම පිරිවැය අයිතමය පොහොර යෙදවුම සඳහා වූ අතර දෙවැන්න බීජ වී සඳහා විය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවීහු, නිර්දේශ කළ ප්‍රමාණයට වැඩි පොහොර ප්‍රමාණයක් උපයෝගී කර ගත් බව පෙනෙන අතර පොළොන්නරුව සහ ඇලහැර ගොවීහු උපයෝගී කර ගත් පොහොර ප්‍රමාණය නිර්දේශ කළ පොහොර ප්‍රමාණයට වඩා අඩුය.

මහනුවර සහ කොළඹ යන දිස්ත්‍රික්ක දෙකෙහි අක්කරයක ලාභ ආන්තික පිළිවෙලින් රු. 425.00 සහ රු. 152.00 වූ අතර වියලි කලාපයේ දිස්ත්‍රික්ක තුනක එම ලාභාංතික රු. 700.00 ඉක්මවූ බව පෙනේ. මෙම අවස්ථාවේදී පිරිවැය අයිතමයන්ට බිම් කුලිය ඇතුළත් නොකල නිසා භූමියට සහ පරිපාලනයට (පවුල් ශ්‍රමය) ලැබුණු ප්‍රතිලාභ ලාභාංතිකය ලෙස සැළකිනි. පවුලේ ශ්‍රම ශක්තිය සහ කෘෂිකාර්මික කටයුතුවල යොදා ගැනීම සඳහා පවුලට අයත් යාන්ත්‍රික සහ සත්ව බල ප්‍රමාණය අනුව පවුල් ගොවි ඉපැයුම් සෑහෙන පමණ වෙනස්කම් පෙන්වයි. පවුලේ ශ්‍රමය සහ පවුලට අයත් මී හරකුන් උපයෝගී කර ගත් ඇලහැර ගොවිපලවල පවුල් ගොවි ඉපැයුම් උපරිම විය; එනම් අක්කරයකට රු. 970.00 කි. අක්කරයකට රු. 299.00 ලැබුණු කොළඹ දිස්ත්‍රික්කය අවම ස්ථානය ගනී.

බුසලක නිෂ්පාදන පිරිවැය ඒ ඒ ප්‍රදේශයන් අනුව සෑහෙන පමණ වෙනස් වෙයි. වියලි කලාපයේ ජල සම්පාදනය සහිත ප්‍රදේශයන් හා සසඳන විට තෙත් කලාපයේ දිස්ත්‍රික්කවල නිෂ්පාදන පිරිවැය අධික බව පෙනේ. අක්කරයකට උපරිම අස්වැන්නක් සටහන් වූ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී බුසලක නිෂ්පාදන පිරිවැය ඉතා අඩු විය; එනම් රු. 8.85 කි. අනෙක් අතට අක්කරයක අස්වැන්න අවම වූ කොළඹ දිස්ත්‍රික්කයෙහි බුසලක පිරිවැය උපරිම විය; එනම් රු. 15.15 කි. එකතු කර ගත් තොරතුරු අනුව වී බුසලක් නිෂ්පාදනය කිරීමට යන මුළු පිරිවැයෙන් ශ්‍රම පිරිවැය පමණක් 50% කට ස්වල්පයක් අධික විය. මිල ව්‍යුහයේ ඊළඟ වියදම් අධික අයිතමය නම් සත්ව සහ යාන්ත්‍රික බලය සඳහා වූ පිරිවැයයි. හම්බන්තොට දිස්ත්‍රික්කය හැර අන්‍ය ප්‍රදේශවල පොහොර සඳහා වූ වියදම සාපේක්ෂ වශයෙන් සුළු වූ අතර එය බුසලක නිෂ්පාදන පිරිවැයෙන් 8% ක් පමණක් විය.

තියැදියේ ගොවීන්ගේ නිෂ්පාදන පිරිවැය ඔවුන්ගේ ඉඩම් භුක්ති තත්වයන්ට සම්බන්ධතොට පරීක්ෂා කරන ලදී. අධ්‍යයනයෙහි තොරතුරු අනුව ඉඩම් හිමියන්ට ගෙවන

ලද සාමාන්‍ය බෝග පංගුව හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි 24% සිට මහනුවර දිස්ත්‍රික්කයෙහි 40% දක්වා විචලනය විය. ඉඩම් හිමි ගොවියන් හා සසඳන කල අඳ ගොවිහු අක්කරයකට උපයෝගී කර ගත් මිනිස් දින ගණන පමණක් නොව උපයෝගී කර ගත් පවුල් ශ්‍රමය ද අධික විය. අඳ ගොවීහු ඉඩම් හිමි ගොවීන් හා සමාන ලෙස පෝර, කෘෂි රසායනික ද්‍රව්‍ය වැනි මිල දී ගන්නා යෙදවුම් සඳහා වියදම් දැරූ බව සඳහන් කිරීම මෙහිදී වැදගත්ය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ මීට වෙනස් තත්වයක් දක්නට ලැබුණු අතර, එම ප්‍රදේශයේ අඳ ගොවීහු ඉඩම් හිමි ගොවීන්ට වඩා ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට අසමත් වූහ. ඉඩම් හිමියන්ට ගෙවන ලද බෝග ප්‍රමාණය පිරිවැය අයිතමයක් ලෙස ඇතුළත් කළ විට ඒ ඒ දිස්ත්‍රික්කවල වී අක්කරයක් සඳහා මුළු පිරිවැය සැහෙන පමණ වෙනස්කම් පෙන්වයි. වී බුසලක් නිෂ්පාදනය කිරීමට ඉඩම් හිමි ගොවියෙකුට වඩා අඳ ගොවියකු දරන පිරිවැය මහනුවර දිස්ත්‍රික්කයේදී රු. 7.00 ක් වූ අතර හම්බන්තොට දිස්ත්‍රික්කයේ රු. 5.00 ක් විය. එහෙත් නිෂ්පාදන පිරිවැයෙන්, බෝග පංගුව සඳහා වූ වැය අඩු කළ විට මෙම කණ්ඩායම් දෙකෙහි බුසලක නිෂ්පාදන පිරිවැයේ වෙනස ආන්තික වේ. පිරිවැය අයිතමයක් වශයෙන් බෝග පංගුව ගෙවීම ඇතුළත් කොට ලාභාංතික ගණනය කළ විට එම වෙනස හම්බන්තොට දිස්ත්‍රික්කය හැර අනික් දිස්ත්‍රික්කවලදී අනික් අතට හැරේ. දිස්ත්‍රික්ක තුනක ලැබුණු සෘණ ලාභාංතිකයන් එක්තරා කරුණක් පෙන්වයි; එනම් බෝග පංගුව පිරිවැයේ අයිතමයක් වශයෙන් ඇතුළත් කළ විට බුසලකට ලැබෙන සහතික මිල වූ රු. 18.00 වඩා අඳ ගොවීන්ගේ නිෂ්පාදන පිරිවැය ඇත්තෙන්ම වැඩි බවයි. එහෙත් තමන් අඳයට ගත් ඉඩම්වල වගා කටයුතු පිළිබඳව තීරණ ගැනීමේදී අඳ ගොවීහු එවැනි ලාභාංතික ගැන සොයා නොබලන බව අපට සිතිය හැක. අලෙවි කිරීමට අතිරික්තයක් නොලබන ගොවීන් නිෂ්පාදන කාර්යයන් සඳහා තීරණ ගැනීමේදී, වීවල සහතික මිල විශාල බලපෑමක් කරතියි විශ්වාස කිරීම අසීරුය. මේ නිසා කුඩා ගොවි පලවල වී නිෂ්පාදනයෙහි ආර්ථික වටිනාකම තීරණය කිරීමේදී බොහෝදුරට විවෘත වෙළඳ පොළෙහි සිල්ලර මිල වඩා තාත්වික මිනුමක් බව උප කල්පනය කරන ලදී. කුඩා ගොවි පලවල නිෂ්පාදනය අගැයීමේදී විවෘත වෙළඳ පොළෙහි මිල භාවිතා කරන විට අඳ ගොවීන්ගේ ලාභාංතිකයන් පිළිබඳව වෙනස් රූපයක් ගොඩ නැගෙන බව පෙනේ.

අක්කරයක නිෂ්පාදනය (y) සහ බුසලක පිරිවැය (c) අතර සම්බන්ධතාවය පහත දැක්වෙන සමීකරණයෙන් පෙන්වා දෙතියි අපේක්ෂා කෙරිණ.

$c = a/y + by$ (1) a සහ b නියතයෝය.

මෙම සමීකරණය දත්තවලට ගලපා ඇති නමුත් කොළඹ හැර අන්‍ය ප්‍රදේශවල සඳහා වන නිමානයන් එතරම් ප්‍රවුබ නොවේ.

$c = a/y$ සමීකරණයේ a නියතය වන අතර අන්‍ය අධ්‍යයන ප්‍රදේශ සඳහා ඉතා මැනවින් ගැලපෙයි.

මෙම සමීකරණය අනුව අක්කරයක පලදාව සහ බුසලක පිරිවැය එක් එක් අධ්‍යයන ප්‍රදේශය සඳහා පරීක්‍ෂා කර බලන ලදී. බුසලක සහතික මිළ රු. 18.00 වූ විට, නිෂ්පාදන පිරිවැය හා අස්වැන්නෙන් ලබන මුදල සමාන විය යුතු වන්නේ පහත සඳහන් පලදාව අනුවය.

අධ්‍යයන ප්‍රදේශය	අක්කරයක නිෂ්පාදන පිරිවැය රු. 18.00 ක් වන විට ඊට අනුරූප පලදාව (බුසල්)
හම්බන්තොට	30.26
පොළොන්නරුව	38.53
ඇලහැර	42.37
කුරුණෑගල	36.67
මහනුවර	41.55
කොළඹ	30.44

වී බුසලක මිල රු. 18.00 ක් වූ විට යම්කිසි ලාභයක් ලබා ගැනීම සඳහා හම්බන්තොට සහ කොළඹ දිස්ත්‍රික්කයන්හි යටත් පිරිසෙයින් බුසල් 30 ක් ද, අනුරාධපුරය සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි බුසල් 38 ක් ද ලැබිය යුතු බව පෙනී යයි. මහනුවර හා පොළොන්නරුව යන ප්‍රදේශවල අක්කරයකින් බුසල් පිළිවෙලින් 42 සහ 38 කට වැඩි වන විට පමණක් නිෂ්පාදන පිරිවැය සහතික මිල සමඟ සමප්‍රතිභේදනය වෙයි.

බුසලක ලාභ සහ අක්කරයක ලාභයන් නිමානය කිරීමේදී පිරිවැය ශ්‍රිතයක් භාවිතා කරන ලදී. අස්වැන්න අඩු අවස්ථාවලදී බුසලක සහ අක්කරයක ලාභයන් දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට සැහෙන පමණ වෙනස් වෙයි. අක්කරයක අස්වැන්න බුසල් 70 කට වැඩි වූ විට බුසලක් සහ අක්කරයක් සඳහා ලැබෙන ලාභයෙහි යම් ඒකීය බවක් කොළඹ හැර අනෙකුත් අදාළ දිස්ත්‍රික්කවල පෙන්නුම් කෙරේ. නියැදියෙහි විශාලත්වය නොසෑහීමත් එහි සසම්භාවී ස්වරූපයක් නොවීමත් නිසා විශ්ලේශනයෙහි සීමාවන් විශේෂයෙන් සඳහන් කිරීම අවශ්‍ය වෙයි. මේ නිසා විශ්ලේෂනයෙහි ප්‍රතිඵල විවරණය කිරීමේදී ඉතාමත් ප්‍රවේශම් විය යුතුය.

නිෂ්පාදන පිරිවැය මත මිල තීරණය කිරීමේදී ප්‍රශ්න රැසක් මතු වෙයි. අහස් වැසි තත්වයන් යටතේ ගොවිතැන් කටයුතු කරන කුඩා ගොවි කාණ්ඩවලට මෙන්ම ජල සම්පාදනය යටතේ ගොවිතැන් කරන සාපේක්ෂ වශයෙන් ලොකු ඉඩම් හිමි ගොවියන්ට සාධාරණ මිලක් ලැබෙන සේ පිරිවැය මට්ටම් රඳවා ගැනීම විසඳා ගත යුතු එක්තරා මූලික ගැටළුවකි. වී නිෂ්පාදනය දියුණු කිරීමට මනා පෙළඹවීමක් වශයෙන් ගොවීන් විසින් දරන ලද නිෂ්පාදන පිරිවැය ද ඇතුළුව සැහෙන පමණ ලාභ ආන්තිකයන් ලැබීමට හැකිවනසේ රජය මගින් වී සඳහා ගෙවන සහතික මිල තීරණය වී ඇති බව මෙහිදී අවධාරණය කළ යුතුය.

සටහන් ලේඛනය

			පිටුව
I–1 වන සටහන	–	තබා ගන්නා ලද වාර්තා පොත් පිළිබඳ තොරතුරු	1
I–2 වන සටහන	–	ගොවිපලේ ප්‍රමාණය අක්කරයක අස්වැන්න සහ යාන්ත්‍රික හා සත්ව බලයෙහි අයිතිය – මහ 1972/73	2
I–3 වන සටහන	–	උපයෝගී කර ගත් සත්ව/යාන්ත්‍රික බල වර්ග අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය ...	3
I–4 වන සටහන	–	විවිධ වී වර්ග හා වැපුරූ හෝ පැළ සිටවූ ක්‍රම යන පදනම් මත 1972/73 මහ කන්නයෙහිදී බිම් ප්‍රමාණයේ ප්‍රතිශතක ව්‍යාප්තිය ...	4
I–5 වන සටහන	–	1972/73 මහ කන්නයේ පැවති ජල සැපයුම් තත්වයන් අනුව ගොවීන්ගේ ප්‍රතිශත ව්‍යාප්තිය	5
I–6 වන සටහන	–	ජලය සැපයුම අනුව වගා කරන ලද භූමි ප්‍රමාණයේ ප්‍රතිශත ව්‍යාප්තිය ...	5
II–1 වන සටහන	–	ශ්‍රමය, සත්ව සහ යාන්ත්‍රික බලය උපයෝගී කර ගැනීමේ රටාව ...	6
II–2 වන සටහන	–	ඉඩම් භුක්ති කණ්ඩායම් අනුව කායික ශ්‍රමය උපයෝගී කර ගැනීම	8
III–1 වන සටහන	–	තුඹුරු අක්කරයක නිෂ්පාදන පිරිවැය (රු.) මහ 1972/73 ...	11
III–2 වන සටහන	–	මුළු නිෂ්පාදන පිරිවැයෙහි කුලී ශ්‍රමය, සත්ව සහ යාන්ත්‍රික බලය සඳහා වූ පිරිවැය මුළු අනුපාතය	12
III–3 වන සටහන	–	අක්කරයක් සඳහා මිලදී ගත් යෙදවුම්වල පිරිවැය (රුපියල්)	13
III–4 වන සටහන	–	වගාව සඳහා නිර්දේශ කරන ලද ප්‍රමාණයන් අනුව පොහොරවල තක්සේරු පිරිවැය ...	14
III–5 වන සටහන	–	අක්කරයක් සඳහා ලාභාංශිකයන් හා පවුල් ගොවි ඉපැයුම්	15
IV–1 වන සටහන	–	බුසලක නිෂ්පාදන පිරිවැය ...	18

පිටුව

V–1 වන සටහන – භුක්ති තත්වයන් අනුව අක්කරයක නිෂ්පාදන පිරිවැය, ගොවිපල වියදම්, ලාභාංශිකයන් සහ පවුල් ගොවි ඉපැයුම් 21

V–2 වන සටහන – බීම් බද්ද වශයෙන් ගෙවූ බෝග පංගුව අනුව අඳ ගොවීන්ගේ ව්‍යාප්තිය ... 22

V–3 වන සටහන – 1972/73 මහ කන්නයේ අස්වැන්න නෙලා ගත් කාල පරිච්ඡේදයෙහි අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රදේශවල පැවැති සහල්වල සිල්ලර මිල පදනම් කොටගෙන නිමානය කළ අඳ ගොවීන්ගෙන් ලාභ ආන්තික සහ පවුල් ගොවි ඉපැයුම් ප්‍රමාණයන් 25

VI–1 වන සටහන – නිෂ්පාදන පිරිවැය සහ පලදාව අතර ඇති සම්බන්ධතාවය 30

VI–2 වන සටහන – බුසලක නිමානික පිරිවැය, බුසලක ලාභය සහ අක්කරයක් සඳහා වූ ලාභය 31

1. සාමාන්‍ය තොරතුරු

1.1 අධ්‍යයනය කළ ප්‍රදේශ සහ ගොවීන්ගේ ඉඩම් භුක්ති තත්වය අනුව පවත්වාගෙන යන ලද ගොවි වාර්තා පොත්වල විස්තර සටහන් 1-1 හි දක්වා ඇත.

සටහන 1-1 තබා ගන්නා ලද වාර්තා පොත් පිළිබඳ තොරතුරු

දිස්ත්‍රික්කය	ඉඩම් හිමි ගොවීන්	අඳ ගොවීන්	එකතුව
හම්බන්තොට	4	10	14
පොළොන්නරුව	18	-	18
ඇලහැර	12	-	12
කුරුණෑගල	22	3	25
මහනුවර	14	7	21
කොළඹ	16	8	24
එකතුව	86	28	114

1.2 අධ්‍යයනය කරන ලද ප්‍රදේශ හයෙහි එක් එක් ප්‍රදේශයෙහි අක්කරයක සාමාන්‍ය අස්වැන්න බුසල් වලින් සහ කුඹුරුවල සාමාන්‍ය වපසරිය සටහන් 1-2 හි දක්වා ඇත.

මෙම සංඛ්‍යා අනුව වගා කන්නයේදී වගා කළ කුඹුරුවල සාමාන්‍ය වපසරිය අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි විශාලතම කුඹුරු කැබලි වූ අතර කොළඹ දිස්ත්‍රික්කයෙහි කුඩාම ඒවා විය. එනම් හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි අක්කර 4.81 ක් ද, කොළඹ අක්කර 1.1 ක් ද වෙයි. ඉහළම සාමාන්‍ය අස්වැන්න පොළොන්නරුවෙන් වාර්තා වූ අතර එම ප්‍රමාණය අක්කරයකට බුසල් 86 කි. එම අස්වැන්න කොළඹ දිස්ත්‍රික්කයෙන් ලැබුණු අස්වැන්න මෙන් හරියටම දෙගුණයකි. සත්ව හා ට්‍රැක්ටර් බලය එනම් මී හරක් සහ ට්‍රැක්ටර් යන්ත්‍රවල අයිතියෙහි ස්වභාවය ඒ ඒ දිස්ත්‍රික්කවල විවිධ විය. හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ඇතුළත් කර ගන්නා ලද ගොවීන්ගෙන් එක් අයෙකුට වුවද මී හරක් අයිති නොවීය. මේ අතර මහනුවර දිස්ත්‍රික්කයෙහි ට්‍රැක්ටර් යන්ත්‍ර හිමි එක් ගොවියෙක්වත් නොසිටියේය. නියැදියෙහි ගොවියන් අතුරින් ඇලහැර එක් එක් ගොවියෙකු හැර අන් සියළුම ගොවීහු මී හරක් අයිතිකරුවෝ වූහ.

සටහන 1–2 ගොවිපලේ ප්‍රමාණය අක්කරයක අස්වැන්න සහ යාන්ත්‍රික හා සත්ව බලයෙහි අයිතිය – මහ 1972/73

දිස්ත්‍රික්කය	චක්‍රගත කිරීමට උපයෝගී කර ගත් වාරිතා ගණන	කුඹුරක වපුරන ලද වපසරියේ සාමාන්‍ය අක්කර ගණන	කුඹුරකින් කපා ගන්නා ලද මුළු වී ප්‍රමාණය බුසල්	අක්කරයකට ලැබුණු සාමාන්‍ය අස්වැන්න බුසල්	ගොවීන්ගේ ගණන: ට්‍රැක්ටර් අයිති	ගොවීන්ගේ ගණන: මී හරක් අයිති
හම්බන්තොට	14	4.81	362	75.3	6	–
ඉඩම් හිමි	4	5.81	444	76.4	4	–
අඳ	10	4.40	329	74.8	2	–
පොළොන්නරුව	18	3.97	344	86.6	6	6 (5.0)
ඇලහැර	12	3.98	338	84.9	–	11 (3.3)
කුරුණෑගල	25	1.96	111	56.6	1	4 (2.0)
ඉඩම් හිමි	22	1.98	119	60.1	1	4 (2.0)
අඳ	3	1.83	55	30.1	–	– (–)
මහනුවර	21	1.23	80	65.0	–	4 (3.0)
ඉඩම් හිමි	14	1.43	95	66.4	–	2 (4.5)
අඳ	7	0.82	52	63.4	–	2 (1.5)
කොළඹ	24	1.11	48	43.2	2	6 (3.0)
ඉඩම් හිමි	16	0.84	38	45.2	2	4 (2.0)
අඳ	8	1.64	68	41.4	–	2 (5.5)

සටහන: එක අයිතිකරුවකුට සිටි සාමාන්‍ය මී හරක් බාන් ගණන වරහන් ඇතුලේ ඇති සංඛ්‍යා වලින් පෙන්නුම් කරයි.

1.3 බිම් සකස් කිරීම සඳහා උපයෝගී කර ගන්නා ලද සත්ව/යාන්ත්‍රික බලය පිළිබඳ දත්ත සටහන් 1-3 හි දක්වා ඇත.

සටහන 1-3 උපයෝගී කර ගත් සත්ව/යාන්ත්‍රික බල වර්ග අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය

සත්ව යාන්ත්‍රික බලයෙහි ස්වභාවය	හම්බන්තොට ගණන	%	පොළොන්නරුව ගණන	%	ඇලහැර ගණන	%	කුරුණෑගල ගණන	%	මහනුවර ගණන	%	කොළඹ ගණන	%
ට්‍රැක්ටර් පමණි	13	92.9	8	44.4	-	-	10	40.0	-	-	5	20.8
මී හරක් පමණි	-	-	6	33.4	6	50.0	10	40.0	20	95.2	12	50.0
මී හරක් සහ ට්‍රැක්ටර්	1	7.1	4	22.2	6	50.0	5	20.0	1	4.8	5	20.8
උදළු පමණි	-	-	-	-	-	-	-	-	-	-	2	8.4
එකතුව	14	100.0	18	100.0	12	100.0	25	100.0	21	100.0	24	100.0

උපයෝගී කර ගත් සත්ව හා යාන්ත්‍රික බලය පිළිබඳව වැදගත් වෙනස්කම් විශේෂයෙන් හම්බන්තොට සහ මහනුවර දිස්ත්‍රික්කයන්හි දක්නට ලැබේ. හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි භූමිය සකස් කිරීමට ගොවීන්ගෙන් සියයට අනූ තුනක් (93%) ට්‍රැක්ටර් යන්ත්‍ර පමණක් උපයෝගී කර ගත් අතර මහනුවර දිස්ත්‍රික්කයෙහි ගොවීන් කිසිම යන්ත්‍රයක් මේ සඳහා භාවිතා නොකළහ. ඇත්තෙන්ම ඔවුන්ගෙන් 95% දෙනෙක් භූමිය සකස් කිරීමට මී හරක් උපයෝගී කර ගත්හ. මේ අතර පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි කුඹුරු සකස් කර ගැනීමට ගොවීන්ගෙන් සියයට 44 ක් ට්‍රැක්ටර් පමණක් උපයෝගී කර ගත් අතර එම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ඇලහැර ප්‍රදේශයෙහි මෙම අධ්‍යයනයට සහභාගී වූ ගොවීන්ගෙන් කිසිවෙක් ට්‍රැක්ටර් යන්ත්‍ර උපයෝගී කර නොගත්හ. කොළඹ දිස්ත්‍රික්කයෙහි ද සත්ව/යාන්ත්‍රික බලයෙහි ප්‍රධාන මාධ්‍යය වූයේ මී හරක්ය.

1.4 වගා කළ වී වර්ග සහ උපයෝගී කර ගත් වපුරන හෝ සිටවන ක්‍රම පිළිබඳ විස්තර සටහන් 1.4 හි දක්වා ඇත.

තෙත් කලාපයේ දිස්ත්‍රික්කවල සිටින ගොවීන් හා සසඳන විට වියළි කලාපයෙහි ජල සම්පාදනය ඇති ප්‍රදේශවල වාසය කළ ගොවීන්ගෙන් වැඩි දෙනෙක් නව දියුණු කළ වී වර්ග වගා කරන බව, ගොවීන් වගා කළ වී වර්ග පිළිබඳව සලකා බලනවිට පෙනී යයි. පොළොන්නරුව සහ ඇලහැර යන දිස්ත්‍රික්කයන්හි වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයේම වපුරන ලද්දේ නව දියුණු කළ වී වර්ගයනය. තවද හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් 93% කම මෙම වී වර්ග වගා කරන ලදී. අනෙක් දිස්ත්‍රික්ක තුන හා සසඳන විට මෙම ප්‍රදේශ තුනෙහි අක්කරයක

පලදාව සෑහෙන පමණ අධික බව අපට පෙනේ. කොළඹ දිස්ත්‍රික්කයෙහි වගා කරන ලද මුළු වපසරියෙන් 21% ක සම්ප්‍රදායික වී වර්ග වගා කොට තිබුණේය. ඇලහැර සහ මහනුවර දිස්ත්‍රික්කයන්හි නියැදි ගොවීන් විසින් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් 89% ක පැල සිටුවා තිබුණේය. එහෙත් හම්බන්තොට, කුරුණෑගල සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හි වී ඉසීම වඩා ප්‍රචලිත ක්‍රමය විය. පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි ද මුළු වගා වපසරියෙන් සියයට 77 ක පැල සිටුවා තිබිණ.

සටහන් 1-4 විවිධ වී වර්ග හා වැපුරූ හෝ පැල සිටවූ ක්‍රම යන පදනම් මත 1972/73 මහ කන්නයෙහිදී බිම් ප්‍රමාණයෙහි ප්‍රතිශතක ව්‍යාප්තිය

	හම්බන්තොට	පොළොන්නරුව	ඇලහැර	කුරුණෑගල	මහනුවර	කොළඹ
වපුරන ලද මුළු බිම් ප්‍රමාණය (අක්කර)	67.25	71.50	47.75	49.00	25.75	26.58
වී වර්ග	ප්‍රතිශතය		ප්‍රමාණය			
(අ) නව දියුණු වී						
බීජී 11	80.4	94.4	100.0	71.5	49.5	42.6
එල්ඩී 66	-	5.6	-	10.2	7.8	36.7
එච්අයි 273	2.11	-	-	-	5.8	-
අයිආර් වගී	-	-	-	-	-	-
අන්‍ය	10.3	-	-	2.0	3.9	-
අතුරු එකතුව	92.8	100.0	100.0	83.7	67.0	79.3
පැරණි දියුණු වී						
එච්-4	3.6	-	-	9.2	29.1	-
අන්‍ය	-	-	-	2.0	3.9	-
අතුරු එකතුව	3.6	-	-	11.2	33.0	-
පැරණි වී වගී	3.6	-	-	5.1	-	20.7
මුළු එකතුව	100.0	100.0	100.0	100.0	100.0	100.0
(ඇ) වගා කළ ක්‍රමය						
පැල සිටුවීම	36.6	76.9	88.5	37.8	89.3	11.3
වී ඉසීම	63.4	23.1	11.5	62.2	10.7	88.7
එකතුව	100.0	100.0	100.0	100.0	100.0	100.0

1.5 1972/73 මහ කන්නයේදී මෙම අධ්‍යයනයට අයත් ප්‍රදේශවල ජල සැපයුම් තත්වය සහ එම ප්‍රදේශවල වාරිමාර්ග ක්‍රම හා සම්බන්ධ පිහිටීම 1-5 සහ 1-6 යන සටහන්වල දක්වා ඇත.

සටහන 1-5 1972/73 මහ කන්නයේ පැවති ජල සැපයුම් තත්වයන් අනුව ගොවීන්ගේ ප්‍රතිශත ව්‍යාප්තිය

	හම්බන්තොට		පොළොන්නරුව		ඇලහැර		කුරුණෑගල		මහනුවර		කොළඹ	
අක්කරයක සාමාන්‍ය අස්වැන්න	75.3		86.6		84.9		56.6		65.0		43.2	
ගොවීන්ගේ ගණන	14		18		12		25		21		24	
වගා කන්නයේදී ජල සැපයුම	ගො වී න්											
	ගණන	%	ගණන	%	ගණන	%	ගණන	%	ගණන	%	ගණන	%
හොඳයි	14	100	14	77.8	12	100	18	72.0	18	85.7	15	62.5
නරකයි	-	-	4	22.2	-	-	7	28.0	3	14.3	9	37.5
මුළු එකතුව	14	100	18	100	12	100	25	100	21	100	24	100

සටහන 1-6 ජලය සැපයුම අනුව වගා කරන ලද භූමි ප්‍රමාණයේ ප්‍රතිශත ව්‍යාප්තිය

	හම්බන්තොට	පොළොන්නරුව	ඇලහැර	කුරුණෑගල	මහනුවර	කොළඹ
වගා කළ මුළු භූමි ප්‍රමාණය අක්කර	67.25	71.50	47.75	49.00	25.75	26.58
ජල සැපයුම	ප්‍රතිශත ප්‍රමාණය					
ප්‍රධාන/සුළු වාරිමාර්ග	100.0	82.9	100.0	31.6	10.7	16.9
අහස්දියෙන්	-	17.1	-	68.4	89.3	83.1
මුළු එකතුව	100.0	100.0	100.0	100.0	100.0	100.0

මෙම අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රදේශයෙහි අක්කරයකට ලැබුණු අස්වැන්න ඉතාමත් අඩු වූයේ කොළඹ දිස්ත්‍රික්කයෙහිය. එහි ගොවීන්ගෙන් සියයට 37 ක් ඉතා දුර්වල ජල සැපයුමක් ලද අතර, ඇත්තෙන්ම කොළඹ දිස්ත්‍රික්කයෙහි අක්කරයකට ලැබුණු සාමාන්‍ය අස්වැන්න බුසල් 43 ක් විය. විශේෂයෙන් මහ කන්නයේදී බලාපොරොත්තු තැබිය හැකි ජල සම්පාදන තත්වයන් යටතේ ගොවිතැන් කළ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහ ඇලහැර ප්‍රදේශයෙහි සටහන් වූ අස්වැන්න කොළඹ දිස්ත්‍රික්කයේ සටහන් වූ ප්‍රමාණයට වඩා දෙගුණයක් විය. හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි සියළුම ගොවීන් මනා ජල සැපයුමක් යටතේ ගොවිතැන් කළ අතර එම ප්‍රදේශයෙහි වාර්තා වූ සාමාන්‍ය අස්වැන්න ප්‍රමාණය සෑහෙන පමණ ඉහළ විය.

II. කායික ශ්‍රමය, මී හරක් සහ ට්‍රැක්ටර් උපයෝගී කර ගැනීම

ශ්‍රමය, සත්ව සහ යාන්ත්‍රික බලය, පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය වැනි වී නිෂ්පාදනයෙහි උපයෝගී කර ගන්නා යෙදවුම් අතර ශ්‍රමය මුළු නිෂ්පාදන පිරිවැයෙහි විශාල අයිතමය වෙයි. එමනිසා ශ්‍රමය, සත්ව සහ යාන්ත්‍රික බලය උපයෝගී කර ගැනීමේ රටාව පිළිබඳව මුලින් පරීක්ෂා කර බලමු.

සටහන් II-1 ශ්‍රමය, සත්ව සහ යාන්ත්‍රික බලය උපයෝගී කර ගැනීමෙහි රටාව

	ගොවි පලවල් ගණන	කුඹුරක සාමාන්‍ය භූමි ප්‍රමාණය	අක්කරයක වැඩට යොදා ගත් කායික ශ්‍රම දින ගණන[1]				ට්‍රැක්ටර් දින ගණන[2]	මී හරක් යෙදවූ දින ගණන[2]
			කුලී	අත්තම්	පවුල්	මුළු		
හම්බන්තොට	14	4.81	44.9	-	7.2	52.1	1.4	0.3
%			86.2	-	13.8	100.0		
පොළොන්නරුව	18	3.97	54.6	-	15.6	70.2	1.7	3.7
%			77.8	-	22.2	100.0		
ඇලහැර	12	3.98	42.7	0.4	24.6	67.7	0.6	7.1
%			63.1	0.6	36.3	100.0		
කුරුණෑගල	25	1.96	41.1	5.9	18.6	65.6	1.1	2.9
%			62.6	9.0	28.4	100.0		
මහනුවර	21	1.23	56.8	11.5	28.0	96.3	0.2	7.9
%			59.0	11.9	29.1	100.0		
කොළඹ	24	1.11	34.5	6.1	21.0	61.6	0.7	7.2
%			56.0	9.9	34.1	100.0		

සටහන්: 1. මී හරක්, ට්‍රැක්ටර් රියැදුරන් - කුලියට හෝ අත්තම් හෝ පවුල් ශ්‍රමිකයන් විසින් වැඩ කරන ලද දින ගණන ද ඇතුළත්ය.

2. බිම සකස් කිරීමට හා වී පෑගීමට වැය වූ දින ගණන ද ඇතුළත්ය.

සටහන් II-1 හි දැක්වෙන තොරතුරු වලින්, කුඹුරක සාමාන්‍ය විශාලත්වය අක්කර 2.1 ක් පමණ වන මහනුවර දිස්ත්‍රික්කයෙහි අක්කරයක වගා කටයුතු සඳහා මිනිස් දින 96 ක් වූ සූක්ෂම ශ්‍රම උපයෝගිතාවක් දක්නට ලැබේ. අනික් අතට හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි කුඹුරක සාමාන්‍ය වගා වපසරිය විශාල වූ අතර (අක්කර 4.8) අක්කරයකට උපයෝගී කර ගත් මිනිස් දින ගණන 52 කි. පොළොන්නරුව දිස්ත්‍රික්කය සහ ඇලහැර ප්‍රදේශය යන වියළි කලාපීය ප්‍රදේශ දෙකෙහි ගොවීහු අක්කරයකට වැඩිපුර ශ්‍රම ප්‍රමාණයක් උපයෝගී කරගෙන ඇත. මෙම ස්ථාන දෙකෙහිම වගා කළ බිම් වපසරිය විශාල වුවද

(අක්කර 4.0) කුඹුරු කැබැල්ලක සාමාන්‍ය විශාලත්වය අක්කර 2 ටත් අඩු කුරුණෑගල සහ කොළඹ යන දිස්ත්‍රික්කයන් හා සසඳන විට සාපේක්ෂ වශයෙන් අක්කරයකට කායික ශ්‍රමය වැඩිපුර උපයෝගී කරගෙන ඇති බව පෙනේ. මෙම ප්‍රදේශ දෙකෙහිම ගොවීහු සූක්ෂම ශ්‍රම භාවිතයත්, සහතික ජල සැපයුමත් යටතේ මීට ඉහතදී දැක්වූ පරිදි (සටහන් I-2) එක් බිම් ඒකකයකින් වැඩි වී ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට සමත් වූ බව පෙනේ.

ශ්‍රම භාවිතය පිළිබඳව ලැබුණු තොරතුරු අනුව මෙම අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රදේශවල වී නිෂ්පාදනයේදී කුලී ශ්‍රමය ප්‍රධාන කාර්ය කොටසක් ඉටු කරන බව පෙනී යයි. පොළොන්නරුව සහ හම්බන්තොට යන වියළි කලාපයීය දිස්ත්‍රික්ක දෙකෙහි වී නිෂ්පාදනය සඳහා උපයෝගී කර ගත් කුලී ශ්‍රම අනුපාතය ඉතා ඉහළ වූ අතර පොළොන්නරුවෙහි එම ප්‍රමාණය මුළු ශ්‍රම යෙදවුමෙන් සියයට 78 කි. හම්බන්තොට එම අනුපාතය සියයට 86 ක් විය. මෙම දිස්ත්‍රික්ක දෙකෙහිම ගොවිපලවල සාමාන්‍ය වපසරිය විශාල විය. පොළොන්නරුවේ ගොවීන් වගා කළ කුඹුරුවල විශාලත්වයට සමාන ගොවිපලවල් (අක්කර 3.9) වගා කළ ඇලහැර ගොවීහු සාපේක්ෂ වශයෙන් අඩු කුලී ශ්‍රමයක් උපයෝගී කොට ගත්හ. (සියයට 63 කි) මෙසේ වියළි කලාපයෙහි වී නිෂ්පාදනයෙහිදී ඉතා ඉහළ කුලී ශ්‍රම අනුපාතයක් උපයෝගී කර ගැනීම හුදෙක් විශාල ගොවිපලවල වගා කටයුතු කිරීමට පමණක් සම්බන්ධ කිරීමට නොහැකිය. පොළොන්නරුව සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක දෙකෙහි අත්තම් ශ්‍රමය කිසිසේත් උපයෝගී නොකර ගැනීම මෙම ප්‍රදේශවල වැඩිපුර කුලී ශ්‍රමයක් යොදා ගැනීමට හේතු වන වැදගත් කරුණක් විය හැකිය. තෙත් කලාපීය දිස්ත්‍රික්ක වන මහනුවර සහ කොළඹ කුඹුරක සාමාන්‍ය විශාලත්වය අක්කරයක් පමණ වුවත් ඒවාහි උපයෝගී කර ගත් මුළු ශ්‍රම යෙදවුමෙන් සියයට 50 කට ආසන්නයක් වැඩි ප්‍රමාණයක් කුලී ශ්‍රම ගනයට වැටේ. වී නිෂ්පාදනයෙහි කන්න ස්වභාවය ඉඩම් සකස් කිරීම සහ අස්වැන්න නෙලා ගැනීම සිදු කෙරෙන කාලවලදී ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් තිබෙන නිසා කුඩා කුඹුරුවල වුවද එක්තරා ප්‍රමාණයක කුලී ශ්‍රමයක් උපයෝගී කර ගැනීම අවශ්‍ය වෙයි. නිෂ්පාදන කටයුතු සඳහා ඉහළ කුලී ශ්‍රම අනුපාතයක් උපයෝගී කර ගැනීමෙන් අදහස් වන්නේ වී නිෂ්පාදකයන්ට ලැබෙන පවුල් ගොවි ඉපැයුම් අඩු වන බවය. ගොවීන්ගේ ඉඩම් භුක්ති තත්වය පදනම් කරගෙන කායික ශ්‍රමය උපයෝගී කර ගැනීම පිළිබඳ තොරතුරු සටහන II-2 හි දක්වා ඇත. හම්බන්තොට ඉඩම් හිමි ගොවීන් සහ අනික් දිස්ත්‍රික්ක තුනෙහි අඳ ගොවීන් ඇතුළත් වූ ප්‍රමාණය නොසෑහෙන නිසා මෙම වර්ගීකරණය, ගොවීන්ගේ ඉඩම් භුක්ති තත්වය පදනම් කරගෙන උපයෝගී කරන රටාව පිළිබඳ යම් අදහස් ඉදිරිපත් කිරීමට තරම් නොසෑහේ. එසේ වුවද, ප්‍රදේශයේ ඉඩම් භුක්ති කණ්ඩායම් දෙක අතර දක්නට ලැබෙන ශ්‍රම උපයෝගී කර ගැනීමේ රටාව පිළිබඳව යම් අදහසක් මෙම සංඛ්‍යා ලේඛන වලින් ලැබෙනු ඇත.

සාමාන්‍යයෙන් කොළඹ දිස්ත්‍රික්කය හැර අන්‍ය ප්‍රදේශවල අඳ ගොවීන් ඉඩම් හිමියන්ට වඩා අක්කරයකට වැඩිපුර මිනිස් දින ගණනක් උපයෝගී කර ගන්නා ප්‍රවණතාවක් සටහන් II-2 හි දැක්වෙයි. මේ වෙනස මහනුවර දිස්ත්‍රික්කයෙහි ඉතා හොඳින් පෙනේ. එහි අඳ ගොවීහු අක්කරයක් වගා කිරීමට ඉඩම් හිමි ගොවීන්ට වඩා වැඩිපුර මිනිස් දින 20 ක් උපයෝගී කරගෙන ඇත. වගා කටයුතුවලදී අඳ ගොවීහු තම පවුල් ශ්‍රමය මත වැඩිපුර යැපෙන බව සඳහන් කිරීමද මෙහිදී අදාළ වේ. මුළු ශ්‍රම ප්‍රමාණය අනුව අඳ

ගොවීහු උපයෝගී කර ගත් පවුල් ශ්‍රම අනුපාතය දිස්ත්‍රික්ක පහේම ඉහලම මට්ටමක විය. උපරිම අනුපාතය කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර දෙවැනි තුන්වෙනි ස්ථානයන් පිළිවෙලින් මහනුවර සහ කොළඹ දිස්ත්‍රික්කවලට හිමි විය.

සටහන් II–2 ඉඩම් භුක්ති කණ්ඩායම් අනුව කායික ශ්‍රමය උපයෝගී කර ගැනීම

	ගොවි පලවල් ගණන	කුඹුරක සාමාන්‍ය විශාලත්වය (අක්කර)	අක්කරයක සාමාන්‍ය වී අස්වැන්න (බුසල්)	අක්කරයකට උපයෝගී කර ගත් මිනිස් දින ගණන			
				කුලී	අත්තම්	පවුල්	මුළු
හම්බන්තොට							
ඉඩම් හිමි	4	5.81	76.4	42.3	–	5.2	47.5
%				89.1	–	10.9	100.0
අඳ	10	4.40	74.8	46.3	–	8.3	54.6
%				84.8	–	15.2	100.0
කුරුණෑගල							
ඉඩම් හිමි	22	1.98	60.1	43.2	4.8	16.5	64.5
%				67.0	7.4	25.6	100.0
අඳ	3	1.83	30.1	24.3	15.6	35.6	75.5
%				32.2	20.7	47.1	100.0
මහනුවර							
ඉඩම් හිමි	14	1.43	66.4	59.9	7.6	24.2	91.7
%				65.3	8.3	26.4	100.0
අඳ	7	0.83	63.4	46.0	24.3	41.3	111.6
%				41.2	21.8	37.0	100.0
කොළඹ							
ඉඩම් හිමි	16	0.84	45.2	41.1	7.3	21.3	69.7
%				58.9	10.5	30.6	100.0
අඳ	8	1.64	41.4	27.7	4.8	19.8	52.3
%				53.0	9.2	37.8	100.0

හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි මෙම කණ්ඩායම් දෙකම පවුල් ශ්‍රමය ඉතා අඩුවෙන් උපයෝගී කොට ගතිහ. ශ්‍රමය වඩා සූක්ෂම ලෙස උපයෝගී කර ගත්තද දිස්ත්‍රික්ක පහේම අඳ ගොවීහු අඩු අස්වැන්නක් ලැබූහ. (සටහන් 1–2).

ඉඩම් භුක්ති කණ්ඩායම්වල ශ්‍රම උපයෝගී කර ගැනීමේ රටාව සහ අක්කරයට ලබා ගත් අස්වැන්න සම්පිණ්ඩනයක් වශයෙන් පහත දක්වා ඇත.

ඉඩම් භුක්තිය	ශ්‍රම උපයෝගී රටාව	අස්වැන්න
ඉඩම් හිමි ගොවියා	(අ) සාපේක්ෂ වශයෙන් අක්කරයකට අඩු ශ්‍රම ප්‍රමාණයක් උපයෝගී කර ගන්නා ලදී. (ආ) අක්කරයකට අඩු පවුල් ශ්‍රම අනුපාතයක් උපයෝගී කර ගන්නා ලදී.	අක්කරයක අස්වැන්න ඉහළ මට්ටමක විය.
අඳ ගොවියා	(අ) සාපේක්ෂ වශයෙන් අක්කරයකට වැඩි ශ්‍රම ප්‍රමාණයක් උපයෝගී කර ගන්නා ලදී. (ආ) අක්කරයකට අඩු පවුල් ශ්‍රම අනුපාතයක් උපයෝගී කර ගන්නා ලදී.	අක්කරයක අස්වැන්න පහළ මට්ටමක විය.

සත්ව හා යාන්ත්‍රික බලය සලකා බලන කල ඇලහැර හැර වියලි කලාපයේ අන්‍ය දිස්ත්‍රික්කයන්හි උපයෝගී කර ගත් ට්‍රැක්ටර් දින ගණන තෙත් කලාපීය දිස්ත්‍රික්කවලට වඩා සෑහෙන පමණ වැඩිය. පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි පිහිටා ඇති ඇලහැර යෝජනා ක්‍රමයෙහි අක්කරයට උපයෝගී කර ගත් ට්‍රැක්ටර් දින ගණන (ට්‍රැක්ටර් දින 0.6) පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි දින ගණනට (ට්‍රැක්ටර් දින 1.7) වඩා අඩුය. ඇලහැර උපයෝගී කර ගත් සත්ව හා යාන්ත්‍රික බලය, වගාව සඳහා වැඩිපුර මී හරක් යොදා ගත් නුවර සහ කොළඹ දිස්ත්‍රික්කවල උපයෝගී රටාවට ඉතාමත් සමානය. අනෙක් වියලි කලාපීය දිස්ත්‍රික්ක තුනෙහි සත්ව/යාන්ත්‍රික බලයෙහි ප්‍රධාන මූලය වූයේ ට්‍රැක්ටර් බලයයි. (සටහන් II-1)

III. අක්කරයක නිෂ්පාදන පිරිවැය

වී නිෂ්පාදන පිරිවැය සම්බන්ධයෙන් සාමාන්‍ය අදහසක් ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යයනයට සහභාගී වූ සියළුම ගොවීන් ඉඩම් හිමි ගොවීන් ලෙස මෙම කොටසේදී සලකනු ලැබේ. මේ අනුව සටහන් III-1 හි දක්වා ඇති පිරිවැය අයිතමයන් අතර අඳ ගොවීන්ගේ බෝග පංගු ගෙවීම්, පිරිවැය අයිතමයන් ලෙස ඇතුළත් කොට නැත. බෝග පංගු ගෙවීම ඇතුළු නිෂ්පාදන පිරිවැය පස් වැනි කොටසෙහි වෙනම සාකච්ඡා කොට ඇත.

හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි හැර අධ්‍යයනයට පාත්‍ර වූ අන්‍ය ප්‍රදේශවල අක්කරයක අස්වැන්න සහ පිරිවැය අතර සම්බන්ධතාව සටහන් III-1 හි දක්වා ඇත. පොළොන්නරුව සහ ඇලහැර ප්‍රදේශවල අක්කරයක අස්වැන්න උපරිම වූ අතර අනෙක් දිස්ත්‍රික්කවලට වඩා එම ප්‍රදේශ දෙකෙහි අක්කරයක නිෂ්පාදන පිරිවැය ද අධික බව පෙනේ. අනික් අතට අක්කරයක අස්වැන්න අවම වූ කුරුණෑගල සහ කොළඹ යන දිස්ත්‍රික්ක දෙකෙහිම අක්කරයක නිෂ්පාදන පිරිවැය අඩුය. අස්වැන්නෙහි විශාල වෙනස්කමක් දක්නට ලැබුණද මෙම දිස්ත්‍රික්ක දෙකෙහි අක්කරයක නිෂ්පාදන වියදම් එක සමාන වේ. සාමාන්‍යයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කය හැර අන්‍ය ප්‍රදේශවල අස්වැන්න සහ පිරිවැය එක අතකට ගමන් කිරීමේ ප්‍රවණතාවක් දක්නට ලැබුනද සටහන් III-1 හි දක්වා ඇති පිරිවැය දර්ශකය සහ අස්වැන්න දර්ශකය අනුව එම විචලනයන් දෙක සමාන අනුපාතිකයන්ට වෙනස් නොවන බව පෙනේ. හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි අක්කරයක ඉහල අස්වැන්න කරුණු දෙකක් නිසා සිදු වූවා සේ සැළකිය හැකිය; එනම් යහපත් කාලගුණික තත්වය සහ සටහන් I-5 හි දක්වා ඇති පරිදි මහ කන්නයේදී එම ප්‍රදේශයට මනා ජල සැපයුමක් ලැබීමනිය.

අක්කරයක මුළු පිරිවැය ප්‍රමාණය ප්‍රධාන යෙදවුම් අනුව කොටස් කළ විට කුලී ශ්‍රම පිරිවැය වියදම් අතුරින් ඉතාමත් වැදගත් අයිතමය වෙයි. කොළඹ සහ මහනුවර වැනි කුඩා ඉඩම් කැබලි වගා කළ දිස්ත්‍රික්කවල පවා කුලී ශ්‍රමය සඳහා වූ පිරිවැය මුළු පිරිවැයෙන් සියයට 35 සිට 45 දක්වා විචලනය වෙයි. පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි මෙම අනුපාතය ඊට වඩා වැඩිය. කුලී ශ්‍රම පිරිවැයේ මෙම වෙනස්කම් තරමක් දුරට විවිධ දිස්ත්‍රික්ක වලදී කුලී ශ්‍රමයට ගෙවන ලද වේතන පරිමානවල වෙනස්කම් නිසා සිදු වූ ලෙස සැලකිය හැකියි. ආහාර සැපයීම ඇතුළුව එක මිනිස් දිනකට දරන ලද කුලී ශ්‍රම පිරිවැය පොළොන්නරුවේ උපරිම වූ අතර (රු. 8.00) ඇලහැර සහ මහනුවර එම පිරිවැය අවම විය (රු. 6.00) අනෙක් දිස්ත්‍රික්කවල කුලී හා ආහාර පිරිවැය දවසකට රු. 7.00 ක් පමණ විය. බිම සකස් කිරීම සහ ගොයම් පෑගීම සඳහා කුලියට ගත් මී හරක් සහ ට්‍රැක්ටර් සඳහා වූ පිරිවැය දෙවැනි වැඩි වියදම් අයිතමය වේ.

සටහන III-1 කුඹුරු අක්කරයක නිෂ්පාදන පිරිවැය (රු.) මහ 1972/73

	හම්බන්තොට	පොළොන්නරුව	ඇලහැර	කුරුණෑගල	මහනුවර	කොළඹ
ගොවීන් ගණන	14	18	12	25	21	24
කුඹුරු කැබලිවල සාමාන්‍ය විශාලත්වය	4.81	3.97	3.98	1.96	1.23	1.11
අක්කරයක වී අස්වැන්න බුසල්	75.3	86.6	84.9	56.6	65.0	43.2
අස්වැන්න දර්ශකය #	87	100	98	65	75	50
ශ්‍රමය +						
කුලී ශ්‍රමය	286.63	396.88	273.05	250.53	317.92	226.93
%	44.9	51.8	37.2	38.4	44.4	34.8
අත්තම්	-	-	2.39	30.33	45.53	39.91
%	-	-	0.3	4.6	6.4	6.1
පවුල්	29.58	63.63	134.40	85.54	83.75	109.30
%	4.6	8.3	18.3	13.1	11.7	16.8
මුළු	316.21	460.51	409.84	366.40	447.20	376.14
%	49.5	60.1	55.8	56.1	62.5	57.7
ට්‍රැක්ටර්	179.94	134.85	74.91	117.90	14.18	51.10
%	28.2	17.6	10.2	18.1	2.0	7.8
මී හරක්						
කුලී	3.66	40.22	82.20	39.50	111.08	87.88
%	0.6	5.3	11.2	6.1	15.5	13.5
අයිති	-	20.50	40.08	7.85	26.46	27.77
%	-	2.7	55	1.2	3.7	4.3
යෙදවුම් ද්‍රව්‍ය	122.55	92.54	86.40	94.70	91.96	104.71
%	19.1	12.1	11.8	14.5	12.8	16.1
විවිධ	16.55	17.05	40.69	25.93	25.01	3.81
%	2.6	2.2	5.5	4.0	3.5	0.6
මුළු	638.91	765.67	734.12	652.28	715.89	651.41
%	100.0	100.0	100.0	100.0	100.0	100.0
මුළු පිරිවැය දර්ශකය #	83	100	96	85	93	85

සටහන:

අස්වැන්න හා පිරිවැය දර්ශකයන් නිර්මානය කිරීමේදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අස්වැන්න හා පිරිවැය සංඛ්‍යා උපයෝගී කර ගන්නා ලදී.

+ මීට කුලී මෙන් අත්තම් ශ්‍රමිකයන්ට සැපයූ ආහාරවල තක්සේරු කරන ලද වටිනාකම ඇතුළත් කොට ඇත.

කුලී ශ්‍රමය සත්ව සහ යාන්ත්‍රික බලය සඳහා වැය වූ මුදල් එකට ගත් විට අක්කරයක මුළු නිෂ්පාදන පිරිවැයෙන් සෑහෙන අනුපාතයක් මේ සඳහා වෙන් වන බව පෙනේ.

සටහන් III-2 මුළු නිෂ්පාදන පිරිවැයෙහි කුලී ශ්‍රමය, සත්ව හා යාන්ත්‍රික බලය සඳහා වූ පිරිවැය මුළු අනුපාතය

දිස්ත්‍රික්කය	කුලී ශ්‍රම පිරිවැය %	ට්‍රැක්ටර් %	මී හරක් %	කුලී ශ්‍රම සත්ව හා යාන්ත්‍රික බලය සඳහා වූ පිරිවැය %	නිෂ්පාදන මුළු පිරිවැය %
හම්බන්තොට	44.9	28.2	0.6	73.7	100
පොළොන්නරුව	51.8	17.6	8.0	77.4	100
ඇලහැර	37.2	10.2	16.7	64.1	100
කුරුණෑගල	38.4	18.1	7.3	63.8	100
මහනුවර	44.4	2.0	19.2	65.6	100
කොළඹ	34.8	7.8	17.8	60.4	100

අධ්‍යයනයට පාත්‍ර වූ සියළුම ප්‍රදේශවල මුළු නිෂ්පාදන පිරිවැයෙන් සියයට 60 කට වැඩි ප්‍රමාණයක් කුලී ශ්‍රමය, සත්ව හා යාන්ත්‍රික බලය සඳහා වියදම් විය. පොළොන්නරු දිස්ත්‍රික්කයේ මෙම අයිතමයන් දෙක සඳහා දරන ලද වියදම මුළු නිෂ්පාදන පිරිවැයෙන් 77% ක් පමණ ඉහළ මට්ටමක විය. මෙම වියදම් රටාව මෙලෙස පවතී නම් බීජ වී කෘත්‍රිම පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍යවල මිල ගණන් වැඩි වීමකට වඩා ශ්‍රමය, සත්ව හා යාන්ත්‍රික බලයෙහි මිල ගණන් වැඩි වීම ගොවීන්ට තදබල ලෙස බලපාන බව පෙනේ. මෙසේ බීජ වී, කෘතිම පෝර වැනි යෙදවුම් උපයෝගී කර ගන්නා රටාවෙහි පැන නැගී ඇති ගැටළු බොහොමයකට හේතුව ඒවායේ මිල වෙනස් වීමකට වඩා ඒවා වෙළඳ පොලේ මිලදී ගැනීමට නොමැති වීමය.

සටහන III-3 අක්කරයක් සඳහා මිලදී ගත් යෙදවුම්වල පිරිවැය (රුපියල්)

	බීජ වී	පෝර	කෘෂි-රසායන	මුළු පිරිවැය
හම්බන්තොට	24.58	75.35	22.62	122.55
%	3.8	11.8	3.5	19.1
පොළොන්නරුව	23.25	62.73	6.56	92.54
%	3.0	8.2	0.9	12.1
ඇලහැර	17.90	60.71	7.79	86.40
%	2.4	8.3	1.1	11.8
කුරුණෑගල	21.33	55.79	17.58	94.70
%	3.3	8.5	2.7	14.5
මහනුවර	20.40	60.57	10.99	91.96
%	2.8	8.5	1.5	12.8
කොළඹ	25.09	53.80	25.82	104.71
%	3.8	8.3	4.0	16.1

<u>සටහන</u>: වාර්තා කර ඇති ප්‍රතිශතයන් මුළු නිෂ්පාදන පිරිවැයෙන් යෙදවුම් පිරිවැය සඳහා වන අනුපාතය දක්වෙයි.

මිලදී ගත් යෙදවුම් සඳහා දරන ලද සාමාන්‍ය පිරිවැයෙහි සැලකිය යුතු වෙනස්කම් දක්නට ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ අක්කරයක් වගා කිරීම සඳහා උපයෝගී කර ගත් යෙදවුම්වල මුළු පිරිවැය රු. 122.00 ක් වූ අතර ඇලහැර ඒ සඳහා වැය වූයේ රු. 86.00 ක් පමණක් වුවද ප්‍රදේශ දෙකෙහිම ඉහළ අස්වැන්නක් වාර්තා විය. අනෙක් අතට අක්කරයක් සඳහා අවම අස්වැන්නක් වාර්තා වූ කොළඹ දිස්ත්‍රික්කයේ අක්කරයක් සඳහා උපයෝගී කර ගත් ද්‍රව්‍ය යෙදවුම්වල මුළු පිරිවැය සෑහෙන පමණ අධික විය. එනම් අක්කරයකට රු. 104.00 කි. අධ්‍යයන කරන ලද සියළුම ප්‍රදේශවල මිල අධිකතම යෙදවුම් අයිතමය පෝර වූ අතර දෙවැනිත බීත්තර වී විය. විවිධ ප්‍රදේශවල කෘෂි-රසායන ද්‍රව්‍ය සඳහා දරන ලද මුළු වියදමෙහි සෑහෙන පමණ වෙනස්කම් දක්නට ඇත. හම්බන්තොට හා කොළඹ යන දිස්ත්‍රික්කයන්හි මෙම අයිතමය සඳහා දරන ලද වියදම අක්කරයකට රු. 22.00 සිට රු. 25.00 දක්වා වූ අතර පොළොන්නරුව හා ඇලහැර යන ප්‍රදේශවල මෙම අයිතමය සඳහා අක්කරයකට වැය වූයේ රුපියල් අටකටත් අඩු මුදලකි. හම්බන්තොට හා කොළඹ යන ප්‍රදේශවල ගොවීහු කෘෂි-රසායනික ද්‍රව්‍ය නොමසුරුව උපයෝගී කර ගත් බව තබා ගන්නා ලද වාර්තා වලින් පෙනේ. හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි වල් පැලෑටි නාශකයක් යොදා ගැනීම වඩා ප්‍රචලිත වීමට හේතුව එම ප්‍රදේශයේ වගා වපසරියන් විශාල වූ නිසා විය හැකිය. කොළඹ දිස්ත්‍රික්කයෙහි වගා කන්නයේදී කෘමීන්ගෙන් කරදර පැමිණෙන අවස්ථාවන් බහුල නිසා එම ප්‍රදේශයෙහි කෘමි නාශකයන් වඩා ප්‍රචලිත ලෙස භාවිතා කරන්නේ යැයි සිතිය හැක.

පුස්තකාලය
LIBRARY
HARTI
22119

මිලදී ගත් අයිතමයන්ගෙන් උපරිම පිරිවැයක් දැරූ අයිතමය පෝර වූ නිසා පෝර උපයෝගී කර ගන්නා රටාව සවිස්තරව පරීක්‍ෂා කරන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කරන ලද සහනාධාර පෝරවල පිරිවැය සහ වගා කරන වී වර්ගයන් සම්බන්ධයෙන් එවැනි නිර්දේශ කරන ලද ප්‍රමාණයන් උපයෝගී කර ගත්තේ නම් පෝරවල තක්සේරු පිරිවැය සටහන් III–4 හි දක්වා ඇත.

සටහන් III–4 වගාව සඳහා නිර්දේශ කරන ලද ප්‍රමාණයන් අනුව පෝරවල තක්සේරු පිරිවැය

දිස්ත්‍රික්කය	වී අක්කර එකක් සඳහා අනුමත කළ පෝර [1]		විවිධ වී වර්ග යටතේ වගා කළ බිම් ප්‍රමා. ව්‍යාප්ති ප්‍රතිශතය [2]		අනුමත කළ පෝර ප්‍රමාණ යොදා ගත්තේ නම් අක්කරය සඳහා පෝර පිරිවැය [3] රු.
	පැරණි දියුණු කළ වී වර්ග සහ සම්ප්‍රදායික වී වර්ග (රු.)	නව දියුණු කළ වී වර්ග (රු.)	පැරණි දියුණු කළ වී වර්ග %	නව දියුණු කළ වී වර්ග %	
හම්බන්තොට	57.48	68.35	7.2	92.8	67.56
පොළොන්නරුව	57.48	68.35	–	100.0	68.35
ඇලහැර	57.48	68.35	–	100.0	68.35
කුරුණෑගල	57.48	62.92	16.3	83.7	62.03
මහනුවර	48.50	64.80	33.0	67.0	59.43
කොළඹ	56.70	67.58	20.7	79.3	65.33

සටහන: 1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පෝර අනුමතයන් මත පදනම් වේ. සහනාධාර පෝර පිරිවැය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සපයන ලද තොරතුරු මත පදනම් වෙයි.
2. පළවෙනි කාණ්ඩයෙහි සටහන් I–4 මගිනි.
3. I සහ 2 මගින් නිමානය කරන ලදී.

මෙසේ ගණනය කරන ලද පිරිවැය සටහන් III–3 හි දැක්වෙන තථ්‍ය පිරිවැය හා සසඳා බලන කල පෝර භාවිතය පිළිබඳව ඉතා වැදගත් කරුණු කිහිපයක් එළිදරව් වෙයි.

I. හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි අක්කරයක් වගා කිරීම සඳහා වැඩි පෝර ප්‍රමාණයක් උපයෝගී කර ගත් බව පෙනේ. මෙම දිස්ත්‍රික්කයෙහි පෝර සඳහා රු. 75.00 ක් වියදම් කර ඇතද නිර්දේශ කළ ආකාරයට පෝර යෙදුවා නම් මෙම අයිතමයේ පිරිවැය රු. 67.00 ක් විය යුතුය.

II. අනික් අතට පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි හා ඇලහැර ප්‍රදේශයෙහි නිර්දේශ ප්‍රමාණයන්ට අඩුවෙන් පෝර භාවිතා කොට ඇත. කෙසේ වෙතත්

අක්කරයක් සඳහා ඉහළම අස්වැන්නක් ලබාගෙන ඇත්තේ මෙම ප්‍රදේශ දෙකිනි.

III. මහනුවර දිස්ත්‍රික්කයෙහි ගොවීහු කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කළ ප්‍රමාණයට සමාන පොහොර ප්‍රමාණයක් වී වගාවේදී උපයෝගී කරගෙන ඇත.

IV. කුරුණෑගල හා කොළඹ යන දිස්ත්‍රික්ක දෙකෙහි ගොවීහු නිර්දේශ කළ ප්‍රමාණයන්ට වඩා අඩු ප්‍රමාණයක් පොහොර භාවිතා කොට ඇත. මෙම ප්‍රදේශ දෙකින් වාර්තා වූ අස්වැන්න ප්‍රමාණයද ඉතා අඩුය.

අක්කරයක් සඳහා ලාභාංශිකයන් සහ පවුල් ගොවි ඉපැයුම් සටහන් III-5 හි දැක්වෙයි.

සටහන් III-5 අක්කරයක් සඳහා ලාභාංශිකයන් හා පවුල් ගොවි ඉපැයුම්

	හම්බන්තොට	පොළොන්නරුව	ඇලහැර	කුරුණෑගල	මහනුවර	කොළඹ
අක්කරයක අස්වැන්න බුසල්	75.4	86.6	84.9	56.8	64.9	43.0
අක්කරයක නිෂ්පාදිත වීවල තක්සේරු අගය රු. (අ)	1357.40	1558.80	1528.20	1022.40	1168.20	774.00
අක්කරයක නිෂ්පාදන පිරිවැය (ආ)	638.91	765.67	734.12	652.28	715.89	651.41
අක්කරයක වියදම් (ඇ)	609.33	681.54	557.25	528.56	560.15	474.43
අක්කරයක ලාභාංශිකය (අ) - (ආ)	718.49	793.13	794.08	370.12	452.31	122.59
අක්කරයක ගොවි ඉපැයුම් (අ) - (ඇ)	748.07	877.26	970.95	493.84	608.05	299.57
වී අස්වැන්න ලබා ගත් වපසරියේ සාමාන්‍යය (අක්කර)	4.81	3.97	3.98	1.96	1.23	1.11
ගොවිපලක ලාභ ආන්තිකයන් රුපියල්	3455.94	3148.73	3160.44	725.44	556.34	136.08
ගොවිපලක පවුල් ගොවි ඉපැයුම් රුපියල්	3598.22	3482.72	3864.38	967.93	747.90	332.52

සටහන්: 1. අක්කරයක නිෂ්පාදනය කරන ලද වීවල අගය තක්සේරු කිරීම සඳහා එවකට පැවැති සහතික මිල උපයෝගී කර ගන්නා ලදී. එනම් බුසල රු. 18.00 කි.

2. අක්කරයක වියදම්, පවුල් සහ අත්තන් ශ්‍රමය මෙන්ම වගා කටයුතුවල යොදා ගත් තමන්ට අයිති මී හරකුන්ගේ ශ්‍රමය හැර අක්කරයක නිෂ්පාදන වියදමට සමානය.

අක්කරයක් සඳහා ඉහළ අස්වැන්නක් වාර්තා වූ දිස්ත්‍රික්කවල ගොවීන් අක්කරයක් සඳහා සෑහෙන පමණ ඉහළ ලාභාංශිකයන් ලබා ගැනීමට සමත් වූ බව පැහැදිලිය. සටහන් III-3 හි දක්වා ඇති ලාභාංශික සටහන් III-1 හි දක්වා ඇති නිෂ්පාදනය කරන ලද වීවල තක්සේරු අගය සහ අදාළ යෙදවුම් අයිතමයන්ගේ පිරිවැය අතර ඇති හුදු වෙනස්කම් වෙයි. ඉහත දක්වන ලද පිරිවැය අයිතමවලට බිම් කුලිය ඇතුළත් නොකල නිසා ඇත්තෙන්ම භූමියට සහ පරිපාලනයට ලැබෙන ප්‍රතිලාභ වලින් පමණක් ලාභාංශික සකස් වී ඇත. පවුල් ගොවි ඉපැයුම් ගණනය කිරීමේදී පවුලේ ශ්‍රමය, අත්තම් ශ්‍රමය සහ පවුලට අයත් මී හරක් ශ්‍රමය, පිරිවැය අයිතමයන් ලෙස නොසලකන ලදී. මේ හේතුවෙන් ඒ ඒ දිස්ත්‍රික්කවල උපයෝගී කර ගත් ශ්‍රමය, සත්ව හා යාන්ත්‍රික බලයෙහි ස්වභාවය අනුව අක්කරයක් සඳහා වූ පවුල් ගොවි ඉපැයුම් ප්‍රමාණයන් සහ ලාභාංශික අතර වෙනස්කම් ඇති වීමේ ආනතිකයක් දක්නට ලැබේ. සාපේක්ෂ වශයෙන් වැඩිපුර පවුල් ශ්‍රමය සහ පවුලට අයත් මී හරක් උපයෝගී කර ගත් කොළඹ දිස්ත්‍රික්කයෙහි හා ඇලහැර ප්‍රදේශයෙහි අක්කරයක් සඳහා ලැබුණු පවුල් ගොවි ඉපැයුම් ප්‍රමාණය ලැබුණු ලාභාංශිකයන්ට වඩා රු. 177.00 කින් වැඩි විය. අනික් අතට වගා කටයුතු වලින් බොහොමයක් කුලී ශ්‍රමය හා යන්ත්‍රෝපකරණ මගින් කරන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි පවුල් ගොවි ඉපැයුම් ලාභාංශිකයන්ට වඩා වැඩි වූයේ මඳ වශයෙනි; එනම් රු. 29.00 කිනි. සටහන් III-5 හි දක්වා ඇති තොරතුරු වලින් එකම දිස්ත්‍රික්ක පිහිටා ඇති ප්‍රදේශ දෙකක - එනම් පොළොන්නරුව හා ඇලහැර, ගොවීන් විසින් ලබා ගත් ලාභාංශික හා පවුල් ගොවි ඉපැයුම් අතර වෙනස්කම් ද දැක්වෙයි. මෙම ස්ථාන දෙකෙහි වී නිෂ්පාදනය සඳහා උපයෝගී කර ගත් ශ්‍රම ප්‍රමාණයන් මෙන්ම (සටහන් II-1) අක්කරයක පිරිවැය ප්‍රමාණයන් ද බොහෝදුරට එක සමාන වෙයි. එහෙත් ඇලහැර ගොවීහු පොළොන්නරුවේ ගොවීන් හා සසඳා බලන විට සාපේක්ෂිත වශයෙන් වැඩි පවුල් ශ්‍රමයක් සහ පවුලට අයත් මී හරක් ප්‍රමාණයක් වගා කටයුතු සඳහා උපයෝගී කර ගත් බව පෙනේ. මෙසේ අක්කරයක් සඳහා උපයෝගී කර ගත් මුළු ශ්‍රම ප්‍රමාණයන්හි සමානකම් සහ අක්කරයක් සඳහා වූ වියදම් බොහෝසෙයින් එක සමාන වුවද ඇලහැර ගොවීන් විසින් අක්කරයකට ලබා ගත් පවුල් ගොවි ඉපැයුම් පොළොන්නරුවේ ගොවීන් ලබා ගත් ප්‍රමාණයට වඩා රු. 93.00 කින් වැඩි විය.

මහනුවර දිස්ත්‍රික්කය සහ ඇලහැර ප්‍රදේශය හැර අන්‍ය ප්‍රදේශවල කුඩා කුඹුරුවල ගොවීන් පවා කුලී ශ්‍රමය, සත්ව සහ යාන්ත්‍රික බලය ඉතා වැඩි ප්‍රමාණයක් උපයෝගී කර ගැනීමත් පවුලේ ශ්‍රමය මත ඉතා අඩුවෙන් යැපීමත් නිසා වී නිෂ්පාදකයින් සාමාන්‍යයෙන් ලාභ ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ගොවිතැන් කරන බව උපකල්පනය කළ හැක. වගා කටයුතුවල කන්න ස්වභාවයත් බිම් සකස් කිරීමට සහ අස්වැන්න කපා ගැනීමට ඇති සීමිත කාලයත් නිසා කන්නයක විවිධ අවස්ථාවල ඇති වන විශාල ශ්‍රම ඉල්ලුම මග හරවා ගැනීම සඳහා එක්තරා ප්‍රමාණයක කුලී ශ්‍රමයක් යොදා ගැනීම අවශ්‍ය වෙයි. තවද සමහර ප්‍රදේශවල සාපේක්ෂ වශයෙන් දක්නට ලැබෙන අඩු වැටුප් ප්‍රමාණ, සමහරවිට කුලී ශ්‍රමය වැඩිපුර යොදවා ගැනීමට එක් හේතුවක් විය හැක. ඇත්තෙන්ම යල් පැන ගිය උපකරණ වලින් වැඩ ගැනීම මහත්සේ වෙහෙස කාරී වීම, ක්ෂේත්‍ර කාර්යයන්හි පවුලේ

උදව්ය වඩා කාර්යක්ෂම ලෙස සහභාගී වීමට දක්වන අකමැත්තට එක හේතුවකි. වී වගාව හා සම්බන්ධ උපකරණ වැඩි දියුණු කිරීම හා නවීන පන්න සෙවීම අතීත පසුගිය දශක කිහිපය තුළ සිදු වී ඇත්තේ ඉතා සුළු දියුණුවක් බව මෙහිදී සඳහන් කළ යුතුය. 'පවුලේ ගොවිපල'[1] යන වචනය වඩා සීමිත අර්ථයකින් භාවිතා කරන විට මෙරට ඉඩම් හිමි ගොවීන් පවා පවුල් ගොවිපලවල් පවත්වාගෙන යන බව කීම උගහටය. ඒ ඒ ගම්වල ගොවීන්ට සේවය සළසන ස්වයංසේවා ග්‍රාමීය ආයතන පිහිටුවා ගැනීම අසාර්ථක වීමට හේතුවක් ලෙස ලංකාවෙහි නියම පවුල් ගොවිපලවල් නොවීම පෙන්වා දිය හැක.

---

1. 'පවුලේ ගොවිපල' – දියුණු වන රටවල භාවිතා කරන නිර්වචනය අනුව ශ්‍රමය යෙදීම හා පරිපාලනයෙහි ඉතා වැඩි කොටසක් කාරකයා හා ඔහුගේ පවුලේ සාමාජිකයින් විසින් ඉටු කරනු ලැබෙන ගොවිතැන් ඒකකයකි.

IV බුසලක නිෂ්පාදන පිරිවැය

අක්කරයක නිෂ්පාදන පිරිවැය හා අස්වැන්න අනුව වී බුසලක නිෂ්පාදන පිරිවැය නිමානය කොට සටහන් IV-I හි දක්වා ඇත.

සටහන IV-I බුසලක නිෂ්පාදන පිරිවැය

	හම්බන්තොට	පොළොන්නරුව	ඇලහැර	කුරුණෑගල	මහනුවර	කොළඹ
අක්කරයක අස්වැන්න බුසල්	75.4	86.6	84.9	56.8	64.9	43.0
යෙදවුම්						
ශ්‍රමය	4.19	5.32	4.83	6.45	6.89	8.75
%	49.41	60.11	55.84	56.14	62.47	57.76
ට්‍රැක්ටර්	2.39	1.56	0.88	2.08	0.22	1.19
%	28.18	17.63	10.17	18.10	1.99	7.85
මී හරක්	0.05	0.70	1.44	0.83	2.12	2.69
%	0.60	7.91	16.65	7.22	19.22	17.76
බීජ වී	0.33	0.27	0.21	0.38	0.31	0.58
%	3.89	3.05	2.43	3.31	2.81	3.83
පොහොර	1.00	0.72	0.72	0.98	0.93	1.25
%	11.79	8.14	8.32	8.53	8.43	8.25
කෘෂි රසායනික ද්‍රව්‍ය	0.30	0.08	0.09	0.31	0.17	0.60
%	3.54	0.90	1.04	2.70	1.54	3.96
අන්‍ය විවිධ	0.22	0.20	0.48	0.46	0.39	0.09
%	2.59	2.26	5.55	4.00	3.54	0.59
බුසලක මුළු පිරිවැය	8.48	8.85	8.65	11.49	11.03	15.15
%	100.00	100.00	100.00	100.00	100.00	100.00
බුසලක ලාභාංතිකය	9.52	9.15	9.35	6.51	6.97	2.85

<u>සටහන</u>: මෙම සටහනෙහි දක්වා ඇති ලාභාංතික සහතික මිළ වූ රු. 18.00 සහ බුසලක නිෂ්පාදන පිරිවැය අතර වෙනස වෙයි.

බුසලක නිෂ්පාදන පිරිවැය සම්බන්ධයෙන් අධ්‍යයනය කරන ලද ප්‍රදේශ හයෙහි සැලකිය යුතු වෙනස්කම් දක්නට ලැබේ. කොළඹ හා මහනුවර යන තෙත් කලාපීය දිස්ත්‍රික්කවල බුසලක නිෂ්පාදන පිරිවැය පොළොන්නරුව හම්බන්තොට සහ ඇලහැර වැනි ජල සම්පාදනය ඇති වියලි කලාපීය ප්‍රදේශ වලින් වාර්තා වූ පිරිවැය ප්‍රමාණයන්ට වඩා අධික බව පෙනේ. අපේක්ෂා කළ ආකාරයකටම අක්කරයකට ලැබුණු අස්වැන්න සහ වී බුසලක

නිෂ්පාදන පිරිවැය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් විය. අක්කරයක අස්වැන්න උපරිම වූ පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි බුසලක නිෂ්පාදන පිරිවැය අවම විය. (රු. 8.85) තවද අක්කරයක අස්වැන්න අවම වූ කොළඹ දිස්ත්‍රික්කයෙහි බුසලක නිෂ්පාදන පිරිවැය උපරිම විය. එනම් රු. 15.15 කි.

සටහන් IV-1 හි දැක්වෙන තොරතුරු අනුව බුසලක නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රධාන සංරචකය ශ්‍රම පිරිවැය වෙයි. මෙම අධ්‍යයනයේදී හඳාරන ලද ගොවිපලවල බුසලක නිෂ්පාදන පිරිවැයෙන් සියයට 50 කට ස්වල්පයකට වැඩි ප්‍රමාණයක් ශ්‍රම පිරිවැය සඳහා විය. පිරිවැය ව්‍යුහයෙහි දෙවැනි වියදම් වැඩි සංරචකය සත්ව හා යාන්ත්‍රික බලය එනම් මී හරක් සහ ට්‍රැක්ටර් යන්ත්‍ර සඳහා දරන ලද පිරිවැය විය. හම්බන්තොට, කුරුණෑගල සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල ට්‍රැක්ටර් යන්ත්‍ර ගාස්තු, පිරිවැය ව්‍යුහයෙහි දෙවැනි වැඩි වියදම් අයිතමය විය. ඇලහැර, මහනුවර හා කොළඹ යන ප්‍රදේශවල මී හරක් සඳහා ගෙවූ ගාස්තු ට්‍රැක්ටර් යන්ත්‍ර සඳහා ගෙවූ ගාස්තුවලට වඩා අධිකය. පෝර සඳහා දැරූ පිරිවැය මුළු නිෂ්පාදන පිරිවැයෙන් සාපේක්ෂ වශයෙන් සුළු ප්‍රමාණයක් වූ අතර කොළඹ දිස්ත්‍රික්කයෙහි හැර අන්‍ය ප්‍රදේශවල එම පිරිවැය ප්‍රමාණය බුසලක් සඳහා රු. 1.00 කට වැඩි නොවීය. හම්බන්තොට දිස්ත්‍රික්කය හැර අන්‍ය ප්‍රදේශවල බුසලක නිෂ්පාදන පිරිවැයෙන් පෝර සඳහා වැය වී ඇත්තේ සියයට 8 ක් පමණ සුළු ප්‍රමාණයකි. හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි ගොවීහු අක්කරයක් වගා කිරීමට පෝර සඳහා ඉහළ පිරිවැයක් දැරූ අතර එම පිරිවැය III කොටසේ නිරීක්ෂණය පරිදි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිල නිර්දේශ ප්‍රමාණයන් සඳහා වූ පිරිවැය ද ඉක්මවූ බව පෙනේ.

සටහන් IV-1 දක්වා ඇති නිෂ්පාදන පිරිවැය තොරතුරු පරීක්ෂා කර බලන කල හම්බන්තොට හැර අනික් ප්‍රදේශ සම්බන්ධයෙන් අක්කරයක අස්වැන්න සහ බුසලක නිෂ්පාදන පිරිවැය අතර එක්තරා සම්බන්ධතාවයක් අඳුනා ගැනීමට පුළුවන.

පහත දැක්වෙන අස්වැන්න–පිරිවැය සම්බන්ධතාව උපකල්පනය කළ හැක:

වී අස්වැන්න (අක්කරයකට බුසල්)	බුසලක පිරිවැය (රුපියල්)
85	8.50 – 9.00 පිට්ටු වශයෙන්
65	11.00 – ,,
55 – 60	12.00 ,,
40 – 45	15.00 – 16.00 ,,

එකතු කර ගන්නා ලද තොරතුරු වලින් නිෂ්පන්න කර ගත් පිරිවැය ශ්‍රිතයන් උපයෝගී කරගෙන අක්කරයක අස්වැන්න සහ පිරිවැය අතර ඇති සම්බන්ධතාව පිළිබඳව වඩාත් සවිස්තර සාකච්ඡාවක් VI කාණ්ඩයේදී ඉදිරිපත් කෙරේ.

V. නිෂ්පාදන පිරිවැය සහ ඉඩම් භුක්තිය

ඉඩම් භුක්ති තත්වයන් අනුව නිෂ්පාදනයේදී සම්පත් උපයෝගී කර ගැනීම් රටාවෙහි වෙනස්කම් දක්නට ඇති නිසා ප්‍රධාන ඉඩම් භුක්ති කණ්ඩායම් දෙක අනුවද නිෂ්පාදන පිරිවැය විග්‍රහ කරන ලදී. ජාතික ආදායම සළකා බලන කල අඳ ගොවියන් විසින් ඉඩම් හිමියන්ට ගෙවන බීම් බද්ද, නිෂ්පාදන ක්‍රියා වලියෙන් බිහි වන නිසා මුළු නිෂ්පාදනයෙහි කොටසක් වෙයි; එහෙත් ගෙවන බදු ප්‍රමාණය කෙතරම් වුවද නිෂ්පාදනයෙන් ලැබෙන මුළු ආදායම එකම මට්ටමෙහි පවතී.

පුද්ගලික අඳ ගොවියාගේ ඇසින් බලන කළ බීම් බද්ද ඉතාමත් අධික වියදම් අයිතමය වෙයි. තමන්ට අයිති කිසි ඉඩමක් නැති ගොවීන්ගෙන් බොහෝ දෙනෙක් තම අස්වැන්නෙන් සාපේක්ෂ වශයෙන් විශාල ප්‍රමාණයක් බද්ද හෝ අඳය හෝ ලෙස ගෙවීමෙන් කුඹුරු බද්දට හෝ අඳයට ගනිති.

ගොවීන්ගේ ඉඩම් භුක්ති රටාව අනුව නිෂ්පාදන පිරිවැය වර්ග කොට සටහන් V-1 හි දක්වා ඇත. පොළොන්නරුව හා ඇලහැර යන ප්‍රදේශ දෙකෙහි ගොවිතැන් කරන ගොවීන් ජනපද යෝජනා ක්‍රමවල ඉඩම් හිමි ගොවීන් නිසා මෙම වර්ගීකරණයෙහි ද, එම ගොවීන් ඇතුළත් නොකරන ලදී. මෙම වර්ගීකරණයට ඇතුළත් වූ ගොවීන්ගේ සංඛ්‍යාව ඉතා සුළු නිසාත් ඔවුන් තෝරා ගැනීම සසම්භාවී ආකාරයකට නො කැරුණු නිසාත් මෙම තොරතුරු අනුව අඳ ගොවීන්ගේ වී නිෂ්පාදනයෙහි ආර්ථික ලක්ෂණ පිළිබඳව කවර නමුත් නිගමනයක් ලබා ගැනීම අසීරු වනු ඇත. කෙසේවෙතත්, දැනට පවතින අඳය වශයෙන් බෝග පංගු ගෙවීමේ ක්‍රමය නිසා අඳ ගොවීන් ජීවත් වන අසතුටුදායක තත්වය පිළිබඳව යම් ඉඟියක් මෙම තොරතුරු වලින් අපට ලබා ගැනීමට හැකි වෙයි. ඉඩම් හිමියන්ට අඳ ගොවීන් විසින් ගෙවන ලදැයි වාර්තා වූ බෝග පංගු පිළිබඳ තොරතුරු සටහන් V-2 හි දැක්වෙයි.

ඉඩම් හිමියන්ට ගෙවන ලද සාමාන්‍ය බෝග පංගු ප්‍රමාණය හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි මුළු අස්වැන්නෙන් සියයට 24 සිට මහනුවර දිස්ත්‍රික්කයෙහි සියයට 40 දක්වා විචලනය වූ බව දක්නට ලැබිණ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ එක ගොවියකුට පමණක් අවිපාරිශවීය ආධාර ලැබිණ. සටහන් V-1 හි තොරතුරු වලින් දැක්වෙන පරිදි කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි හැර අන්‍ය ප්‍රදේශවල ඉඩම් හිමියන් සහ අඳ ගොවීන් අක්කරයකට ලබා ගත් අස්වැන්න ප්‍රමාණවල වෙනස ඉතා සුළු වෙයි. කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි අඳ ගොවීන් අක්කරයකට ලබා ගත් අස්වැන්න ප්‍රමාණය ඉඩම් හිමි ගොවීන් ලබා ගත් ප්‍රමාණයෙන් සියයට 50 ක් පමණ විය. අන්‍ය ප්‍රදේශවල මෙම භුක්ති කණ්ඩායම් දෙක ලබා ගත් අස්වැන්න ප්‍රමාණවල දක්නට ලැබෙන සමානත්වය නිසා සම්පත් උපයෝගී කර ගැනීමේ රටාවෙහි දක්නට ඇති වෙනස්කම් සළකා බැලීම ප්‍රයෝජනවත් විය හැක.

සටහන V–1 භුක්ති තත්වයන් අනුව අක්කරයක නිෂ්පාදන පිරිවැය, ගොවිපල වියදම්, ලාභාංතිකයන් සහ පවුල් ගොවි ඉපැයුම

	හම්බන්තොට		කුරුණෑගල		මහනුවර		කොළඹ	
	ඉඩම් හිමි	අඳ	ඉඩම් හිමි	අඳ	ඉඩම් හිමි	අඳ	ඉඩම් හිමි	අඳ
ගොවිපලවල් ගණන	4	10	22	3	14	7	16	8
කුඹුරක සාමාන්‍ය විශාලත්වය (අක්කර)	5.81	4.40	1.98	1.83	1.43	0.83	0.84	1.64
අස්වැන්න/අක්කරයක (බුසල්)	76.0	74.8	59.9	30.2	65.4	63.3	44.4	41.4
අක්කරයක නිෂ්පාදිත වීවල තක්සේරු අගය (රුපියල්)	1368.00	1346.40	1078.20	543.60	1177.20	1139.40	799.20	745.20
අක්කරයක පිරිවැය (රුපියල්)								
අ. ශ්‍රමය:								
කුලී	274.90	292.83	259.49	179.59	350.20	205.63	236.30	217.25
අත්තම්	–	–	20.39	8.94	28.30	105.45	41.40	38.38
පවුල්	13.61	38.01	73.68	179.32	69.11	134.70	135.89	81.87
ආ. ට්‍රැක්ටර් යන්ත්‍ර	176.13	181.94	119.70	103.63	18.25	–	42.18	60.24
මී හරක්								
කුලී	4.95	2.98	36.03	67.01	120.35	79.15	93.67	81.95
අයිති	–	–	8.00	6.63	20.06	48.51	31.22	24.24
බීජ වී	22.06	25.91	20.21	30.18	19.33	24.12	24.56	25.65
පොහොර	79.46	73.18	57.51	42.13	62.01	55.55	53.77	53.83
කෘෂි-රසායනික ද්‍රව්‍ය	16.45	25.88	16.10	29.30	12.37	6.22	22.10	29.66
විවිධ	11.78	21.40	26.35	22.55	31.66	1.91	6.23	1.30
ගෙවුනු ශෂ්‍ය පංගු	–	323.14	–	179.39	–	455.76	–	283.18
මු ළු	599.34	985.27	637.46	848.67	731.64	1117.00	687.32	897.55
බුසලක පිරිවැය	7.89	13.17	10.64	27.68	11.19	18.15	15.48	21.68
අක්කරයක ගොවිපල වියදම්	585.73	947.26	535.39	653.78	614.17	828.34	469.81	753.06
අක්කරයක ලැභාංතිකයන්	768.66	361.13	440.74	-305.07	445.56	22.40	111.88	-152.35
අක්කරයක පවුල් ගොවි ඉපැයුම්	782.27	399.14	542.81	-110.18	563.03	311.06	329.39	-7.86

සටහන V–2 බිම් බද්ද වශයෙන් ගෙවූ භෝග පංගුව අනුව අඳ ගොවීන්ගේ ව්‍යාප්තිය

	අඳ ගොවීන්ගේ ගණන	ඉඩම් හිමියන්ට ගෙවූ භෝග පංගු ප්‍රමාණයන්						ඉඩම් හිමියන්ට ගෙවූ මුළු භෝග පංගු ප්‍රමාණයන් [2]
		10%	15%	20%	25%	33%	50%	
හම්බන්තොට	10	1	1	1	5	1	1 [1]	24%
කුරුණෑගල	3	–	–	–	2	–	–	33%
මහනුවර	7	–	–	1	2	–	4	40%
කොළඹ	8	1	1	–	1	–	5	38%

සටහන: 1. මෙම අඳ ගොවියාට අක්කරයකට බිත්තර වී බුසල් දෙකක් ඔහුගේ ඉඩම් හිමියාගෙන් ලැබී තිබුනි.

2. සෑම දිස්ත්‍රික්කයකම බර තැබූ මාධ්‍යකය.

මෙම ඉඩම් භුක්ති කණ්ඩායම් දෙක අතර විශේෂයෙන් ශ්‍රමය උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් සැහෙන පමණ වෙනස්කම් ඇති බව දෙවෙනි සටහනේහි දක්නට ලැබිණ. සටහන් II–2 හි දැක්වෙන තොරතුරු අනුව ශ්‍රමය වඩා විස්තීර්ණ ලෙස උපයෝගී කර ගැනීමට සාමාන්‍ය නැඹුරුතාවයක් දැක්වූ හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි පවා ඉඩම් හිමි ගොවියන් හා සසඳන විට අඳ ගොවීන් අක්කරයකට වැඩිපුර මිනිස් දින ගණනක් උපයෝගී කර ගත් බව පෙනේ. අඳ ගොවීන් අඩු මිනිස් දින ගණනක් උපයෝගී කර ගන්නා ලද්දේ කොළඹ දිස්ත්‍රික්කයෙහි පමණි. දිස්ත්‍රික්ක හතරෙහිම අඳ ගොවීන් විසින් අක්කරයක වගා කටයුතු සඳහා උපයෝගී කර ගත් පවුල් ශ්‍රමයේ ප්‍රතිශතකයද ඉඩම් අයිති ගොවීන් හා සසඳන විට වැඩිය.

අත්තන් ශ්‍රමය උපයෝගී කර ගැනීමේ රටාවෙහි යම් සමානකමක් කුරුණෑගල, මහනුවර දිස්ත්‍රික්කයන්හි දක්නට ලැබේ. දෙවෙනි කාණ්ඩයෙහි දක්වා ඇති පරිදි අඳ ගොවීන් විසින් අක්කරයක් සඳහා වැඩිපුර මිනිස් දින 20 ක් උපයෝගී කර ගත් මහනුවර දිස්ත්‍රික්කයෙහි ශ්‍රමය උපයෝගී කර ගැනීම පිළිබඳව බලවත් වෙනස්කම් දක්නට ලැබේ. මහනුවර දිස්ත්‍රික්කයේ අඳ ගොවීන් උපයෝගී කර ගත් මුළු ශ්‍රම ප්‍රමාණයෙන් මිනිස් දින 65; එනම් 58% පවුල් සහ අත්තන් ශ්‍රමයෙන් සැපයින. අනෙක් අතට ඉඩම් හිමි ගොවීහු පවුල් සහ අත්තන් ශ්‍රමය උපයෝගී කර ගත්තේ සැහෙන පමණ අඩුවෙනි; එනම් අක්කරයක් සඳහා උපයෝගී කර ගත් මුළු ශ්‍රමයෙන් 35% ක් හෙවත් මිනිස් දින 31 කි. මෙම තොරතුරු අනුව මහනුවර දිස්ත්‍රික්කයෙහි අඳ ගොවීහු අක්කරයක් සඳහා වැඩිපුර මිනිස් දින ගණනක් උපයෝගී කර ගත්තා පමණක් නොව විවිධ වගා කටයුතුවලදී වැඩිපුර පවුල් සහ අත්තන් ශ්‍රමයද උපයෝගී කර ගත් බව පෙනේ.

මිළට ගන්නා ලද අන්‍ය යෙදවුම් සම්බන්ධයෙන් සලකා බලනවිට කුරුණෑගල දිස්ත්‍රික්කය හැර අන්‍ය ප්‍රදේශවල මෙම භුක්ති කණ්ඩායම් දෙක විසින් අක්කරයක් සඳහා උපයෝගී කර ගත් පෝර කෘෂි–රසායන ද්‍රව්‍ය ප්‍රමාණවල දක්නට ලැබෙන්නේ ඉතා සුළු වෙනසකි. (සටහන් V–1) මහනුවර දිස්ත්‍රික්කයෙහි අඳ ගොවීන් වඩා සූක්ෂම ලෙස ශ්‍රමය සහ අනෙකුත් මිළ දී ගන්නා යෙදවුම් උපයෝගී කර ගත් බව වාර්තා වුවද ඔවුන් ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට අපොහොසත් වූ බව සටහන් කිරීම මෙහිදී වැදගත්ය. මෙම කණ්ඩායම් දෙක විසින් වගා කරන ලද කුඹුරුවල පසෙහි සාරවත් බව විවිධ වීම සහ ජල සැපයුම් තත්වයන් යටතේ ඇති වන වෙනස්කම් වැනි භෞතික සහ පරිසරය ආශ්‍රිත වෙනස්කම් මීට එක් හේතුවක් විය හැකිය.

ඉඩම් හිමියන්ට ගෙවන බෝග පංගුව පිරිවැය අයිතමයක් වශයෙන් ඇතුළත් කළ විට (සටහන් V–1) සියළුම දිස්ත්‍රික්කයන්හි ඉඩම් හිමි ගොවීන් සහ අඳ ගොවීන් අතර අක්කරයක් සඳහා මෙන්ම වී බුසලක් සඳහා දැරූ මුළු පිරිවැයෙහි සෑහෙන පමණ වෙනස්කම් දක්නට ලැබේ. මහනුවර, කොළඹ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි අක්කරයක් සඳහා මෙම ඉඩම් භුක්ති කණ්ඩායම් දෙක ලැබූ අස්වැන්න බොහෝවිට සමාන වුවද බෝග පංගු ගෙවීම ඇතුළත් කළ විට අඳ ගොවීන් වී බුසලක් නිෂ්පාදනය කිරීම සඳහා දැරූ නිෂ්පාදන පිරිවැය සෑහෙන පමණ වැඩි වේ. එවැනි තත්වයන් යටතේ අඳ ගොවියෙකු බුසලක් නිෂ්පාදනය කිරීම සඳහා දැරූ නිෂ්පාදන පිරිවැය මහනුවර දිස්ත්‍රික්කයේදී රු. 7.00 කින් ද, හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි රු. 5.00 කින් ද ඉඩම් හිමි ගොවියෙකු දැරූ පිරිවැයට වඩා වැඩි වේ. අනෙක් අතට බෝග පංගුව ගෙවීම ඉවත් කළ විට බුසලක් නිෂ්පාදනය කිරීම සඳහා දරන ලද වියදම් මෙම කණ්ඩායම් දෙක අතර බොහෝසෙයින් එක සමාන වේ; ඇත්තෙන්ම අඳ ගොවීන්ගේ නිෂ්පාදන පිරිවැය ඉතා පැහැදිලි ලෙස අඩු වෙයි. මහනුවර දිස්ත්‍රික්කයේදී මෙම අඩු වීම බුසලකට රු. 0.25 ක් වෙයි. හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි අඳ ගොවියෙකු බුසලක් නිෂ්පාදනය කිරීමට දරන පිරිවැය ඉඩම් හිමි ගොවියෙකුගේ පිරිවැයට වඩා වැඩි වන්නේ රු. 0.96 කිනි. නිෂ්පාදන පිරිවැයෙහි දක්නට ලැබෙන මෙම වෙනස්කම් මගින් අඳ භූමිය සඳහා බෝග පංගු මගින් අඳ ගෙවීමේ ක්‍රමය යටතේ අඳ ගොවීන් විඳින විශාල පීඩාව පිළිබඳව යම්කිසි අදහසක් ලබා දෙයි.

ඉඩම් භුක්ති කණ්ඩායම් දෙක අක්කරයක් සඳහා ලැබූ ලාභයන් සටහන් V–1 හි දක්වා ඇත. වාර්තාකොට ඇති ලාභ ප්‍රමාණයන්, අක්කරයක නිෂ්පාදනය කරන ලද වීවල තක්සේරු අගය සහ බිම් කුලිය[1] වශයෙන් ගෙවන ලද බෝග පංගුව ද ඇතුළුව අක්කරයක නිෂ්පාදන පිරිවැය අතර ඇති වෙනස වෙයි. මෙම ගණන් බැලීම් අනුව හම්බන්තොට දිස්ත්‍රික්කය හැර අන්‍ය ප්‍රදේශවල අඳ ගොවීන් ලැබූ ලාභාංශයන් ඍණ වූ බව පෙනේ. හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි අඳ ගොවීන් විසින් ගෙවන ලද බෝග පංගුව සාපේක්ෂ වශයෙන් අඩු වීමත් ඔවුන් ඉතා ඉහළ අස්වැන්නක් ලබා ගැනීමත් නිසා අක්කරයකට රු. 361.00 ක් ලාභයක් වාර්තා විය. අනෙක් අතට අනෙක් දිස්ත්‍රික්ක තුනෙන්ම වාර්තා

---

1. අස්වැන්න නෙලා ගත් කාලයෙහි සහතික මිලරු. 18.00 ක් විය. මෙය පදනම් කරගෙන නිෂ්පාදනය කළ වී මෙන්ම ගෙවන ලද බෝග පංගුවලද අගය නිමානය කරන ලදී.

වූ සෘණ ප්‍රමාණයන් මගින් අඳ ගොවීන්ගේ නිෂ්පාදන පිරිවැය වී බුසලකට ලැබෙන සහතික මිළ වූ රු. 18.00 ඉක්මයන බව පැහැදිලි ලෙස පෙන්වයි. කෙසේ වෙතත් අඳ ගොවීන් විසින් වගා කිරීම සඳහා බද්දට ගත් ඉඩම්වල නිෂ්පාදන කටයුතු තීරණය කිරීමේදී එවැනි ලාභාංතික පිළිබඳව සළකා බලතියි සිතීම උගහටය.

කුඩා ගොවිපලවල් වගා කළ අඳ ගොවීන්ට අලෙවි කිරීමට තරම් නිෂ්පාදන අතිරික්තයක් ලබා ගැනීම ඉතා දුෂ්කරය. එවැනි ගොවිපළවල නිෂ්පාදනය කරන ලද වී මූලික වශයෙන් පරිභෝජනය සඳහා වීය. එවැනි ගොවීන්ට අලෙවි අතිරික්තයක් නොලැබෙන නිසා තමන්ගේ ගොවිපලවල නිෂ්පාදනය පිළිබඳව තීරණයක් ගැනීමේදී වීවල සහතික මිළ යම් වැදගත් බලපෑමක් කරතියි සිතීම උගහටය. ගොවිතැන් කිරීම අත් හරින්නේ නම් තම පරිභෝජනය සඳහා විවෘත වෙළඳ පොලෙන් සහල් එක්තරා ප්‍රමාණයක් මිලදී ගැනීමට අඳ ගොවියාට සිදු වෙයි. මෙවැනි තත්වයක් යටතේ නිෂ්පාදනයෙහි ආර්ථික අගය ඇගැයීමට විවෘත වෙළඳ පොලේ වී සිල්ලර මිළ වඩාත් යථාර්ථවත් මිණුමක් සපයන බව උපකල්පනය කළ හැක. අලෙවිය සඳහා සැළකිය යුතු අතිරික්තයක් නොලබන ඉඩම් හිමි ගොවීන්ගේ කුඩා කුඹුරු සම්බන්ධයෙන් වුවද මෙම උපකල්පනය වලංගු වෙයි.

කුඩා ගොවිපලවල නිෂ්පාදනය ඇගැයීමට එවැනි මිණුමක් උපයෝගී කර ගන්නා විට වෙනස් තත්වයක් නිරීක්ෂණය කිරීමට හැකි වෙයි. 1972/73 මහ කන්නයේදී සහල් සේරුවක සිල්ලර මිළ රු. 2.00 කි.[1] සහල්වල සිල්ලර මිළ අනුව නිෂ්පාදනයක් කරන ලද වී බුසලක නිශ්චිත අගය කිට්ටු වශයෙන් රු. 31.40 වෙයි.[2] මෙම ඇගැයුම් පදනම මත අඳ ගොවීන්ගේ ලාභ ආන්තිකයන් සහ ගොවි පවුල් ඉපැයුම් නිමානය කොට සටහන් V–3 හි දක්වා ඇත.

---

1. 1973 මාර්තු මාසයේදී සහල් සලාක ක්‍රමය යටතේ පළවෙනි සහල් සේරුව නොමිලේද, දෙවැනි සේරුව රු. 1.60 කට ද දෙන ලදී.
2.

විවෘත වෙළඳ පොලේ සහල් සේරුවක මිළ		= රු. 2.00
වී බුසල	... ...	= සේරු 32
වී සහල්වලට හැරවීමේ අනුපාතය	.	= 50% (ප්‍රමාණයෙන්)
වී බුසලකින් ලබා ගත හැකි සහල් සේරු ගණන		= සේරු 16
එමනිසා වී බුසලක දළ අගය		
32 X 1/2 X රු. 2.00	...	= රු. 32.00
වී කෙටීමේ කුලිය	...	= රු. .60
වී බුසලක ශුද්ධ අගය	...	= රු. 31.40

සටහන V-3 1972/73 මහ කන්නයේ අස්වැන්න නෙලා ගත් කාල පරිච්ඡේදයෙහි අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රදේශවල පැවති සහල්වල සිල්ලර මිළ පදනම් කොටගෙන නිමානය කළ අඳ ගොවීන්ගෙන් ලාභ ආන්තික සහ පවුල් ගොවි ඉපැයුම් ප්‍රමාණයන්

	කුරුණෑගල	මහනුවර	කොළඹ
අක්කරයක නිෂ්පාදනය කරන ලද වීවල තක්සේරු අගය [1]	948.28	1,987.62	1,299.96
අක්කරයක පිරිවැය [2]	848.67	1,117.00	897.55
අක්කරයක ලාභාංතිකයන්	99.61	870.62	402.41
බුසලක ලාභාංතිකයන්	3.30	13.75	9.72
අක්කරයක පවුල් ගොවි ඉපැයුම්	294.50	1,159.28	546.90
ගොවිපලක පවුල් ගොවි ඉපැයුම්	538.94	962.20	896.92
ගොවිපලකින් ලද හැකි ශුද්ධ ප්‍රමාණය (බුසල්) [3]	37.0	31.5	42.1

<u>සටහන</u>: 1. වී බුසලක මිළ රු. 31.40 ලෙස ගන්නා ලදී. (කල්පිත අගය)

2. මෙහි දක්වා ඇති අක්කරයක පිරිවැය සටහන V-1 දක්වා ඇති පිරිවැය ප්‍රමාණයන් හා සමාන වෙයි.

3. ගොවිපලකින් ලැබෙන ශුද්ධ ප්‍රමාණය = අක්කරයක අස්වැන්න X අඳ ගොවීන් විසින් තබා ගන්නා බෝග පංගුවෙහි % X ගොවිපලක සාමාන්‍ය විශාලත්වය අක්කර වලින්.

විවෘත වෙළඳ පොලේ මිළ ගණන් අනුව ගණනය කරන ලද කුරුණෑගල, මහනුවර සහ කොළඹ යන දිස්ත්‍රික්කවල අඳ ගොවීන්ගේ ලාභාංතික සහ පවුල් ගොවි ඉපැයුම් ප්‍රමාණයන් සටහන් V-1 දක්වා ඇති සංඛ්‍යා වලින් මහත්සේ වෙනස් වන අතර එම ප්‍රමාණයන් තවදුරටත් ඍණ අගයක් නොගන්නා බව සටහන් V-3 සංඛ්‍යා වලින් පෙනේ. අඳ ගොවීන් අක්කරයකට ලබා ගත් සාමාන්‍ය අස්වැන්න ඉතා අඩු වූ (බුසල් 30) කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි පවා අක්කරයක ලාභාංතිකයන් ධන අගයක් ගත් අතර එය රු. 99.00 ක් විය. තවද දිස්ත්‍රික්ක තුනේම අක්කරයක් සඳහා වූ පවුල් ගොවි ඉපැයුම් ප්‍රමාණවලද සෑහෙන පමණ වැඩි වීමක් පෙන්වයි. මෙම ඉපැයුම් බිම් බද්ද ගෙවීමෙන් පසුවද කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි රු. 307.00 සිට මහනුවර දිස්ත්‍රික්කයෙහි රු. 1,127.00 දක්වා විචලනය විය. සටහන් V-3 දැක්වෙන පවුල් ගොවි ඉපැයුම් කුඩා ගොවිපලවල අඳ ගොවීන්ට යම් ආර්ථික වැදගත්කමක් ඇතැයි අදහස් කෙරේ. සටහන් V-3 හි දැක්වෙන ඉපැයීම් කිසිවිටක යැපුම් මට්ටමේ ගොවීන් විසින් මුදලින් ලබා නොගනී. කෙසේ වෙතත් මෙම සංඛ්‍යා වී නිෂ්පාදනයේදී විශේෂයෙන් යෙදවුම් උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් අඳ ගොවීන්ගේ ආකල්පයන් හා

හැසිරීම අවබෝධ කර ගැනීමට ද ප්‍රයෝජනවත් වනු ඇත. යැපුම් මට්ටමේ ගොවියකුට තමන් නිෂ්පාදනය කරන වී වල අගය සහතික මිලට වඩා වැඩි බව පෙනේ. යෙදවුම් උපයෝගී කර ගැනීම පිළිබඳ සාකච්ඡාවෙහිදී අඳ ගොවීන් විසින් ඉඩම් හිමි ගොවීන් තරම්ම හෝ ඊට වැඩි ප්‍රමාණයක් නව දියුණු කල වී වර්ග මෙන්ම පෝර හා කෘෂිරසායනික ද්‍රව්‍යයන් උපයෝගී කර ගන්නා බව එළිදරව් විය. මෙම මිලදී ගන්නා යෙදවුම් සඳහා ඉඩම් භුක්ති කණ්ඩායම් දෙක විසින් දරන ලද පිරිවැය විශේෂයෙන් මහනුවර දිස්ත්‍රික්කයේදී බොහෝදුරට එක සමාන වූ බව III කණ්ඩයෙන් පෙනේ. කුඩා ඉඩම් හිමි ගොවීන් මෙන්ම අඳ ගොවීන් ගෙන් වැඩි ගණනක් අලෙවි කිරීමට තරම් අතිරික්තයක් නොලබන නිසා වී නිෂ්පාදනයෙන් උපයා ගන්නා ආදායමෙන් අත්‍යවශ්‍ය නිෂ්පාදන යෙදවුම් ලබා ගැනීමට මුදල් ලබා ගැනීමට තරම් තත්වයක ඔවුන් පසු නොවන බව පෙනේ. පෝර, කෘෂි-රසායන ද්‍රව්‍ය වැනි මිලදී ගන්නා අයිතමයන් නිර්දේශ කළ ප්‍රමාණයන්ට උපයෝගී කර ගැනීමට කුඩා ඉඩම් හිමි ගොවියන්ට හැකි වන්නේ ගොඩ ඉඩම් වගාව හෝ වෙනත් අතුරු රැකියාවකින් යම් අමතර ආදායමක් ලැබෙන විට පමණි. 1971/72[1]. වර්ෂයේදී මහනුවර දිස්ත්‍රික්කයේ අඳ ගොවීන්ගෙන් වී හැර අන්‍ය මූලයන්ගෙන් රු. 500.00 වැඩි ආදායමක් ලබා ඇත්තේ සියයට 57 ක් පමණි.

---

1. ශ්‍රී ලංකාවේ තෝරා ගත් දිස්ත්‍රික්ක පහක වී නිෂ්පාදනයට අදාළ ගොවිකටයුතු තත්වය II කොටස - මහනුවර දිස්ත්‍රික්කය.

VI. අක්කරයක අස්වැන්න සහ බුසලක පිරිවැය අතර ඇති සම්බන්ධතාවය

අක්කරයක අස්වැන්න සහ බුසලක නිෂ්පාදන පිරිවැය අතර ඇති සම්බන්ධය හැදෑරීමට අක්කරයක නිෂ්පාදන පිරිවැය, අක්කරයක අස්වැන්න සහ ඒ බුසලක නිෂ්පාදන පිරිවැය පිළිබඳව එකතු කර ගන්නා ලද තොරතුරු පරීක්ෂා කරන ලදී.

අක්කරයක අස්වැන්න (y) සහ බුසලක නිෂ්පාදන පිරිවැය (c) අතර ඇති සම්බන්ධතාව පහත දැක්වෙන සමීකරණයෙන් ප්‍රකාශ කිරීමට හැකිවෙතියි අපේක්ෂා කෙරින.

$c = a/y + by$ .... (1) මෙහි a සහ b නියතයෝය.

මෙම සමීකරණය උපයෝගී කරගෙන අක්කරයක පිරිවැය (C) සහ අක්කරයක අස්වැන්න අතර ඇති සම්බන්ධතාවය මෙසේ විස්තර කළ හැකිය:-

$C = a + by^2$ .... (2)

1 වෙනි සමීකරණයෙන් U හැඩය ගන්නා වක්‍රයක් පෙන්නුම් කරන අතර එම වක්‍රය සිරස් අක්ෂයට සාරිශෝන්මුඛ වෙයි. සියළුම අධ්‍යයන ප්‍රදේශයන්ට අදාළ දත්තවලට මෙම සමීකරණය ගලපන ලද අතර කොළඹ හැර අන්‍ය ප්‍රදේශවල ' b ' සඳහා වූ නිමානයන් 5% මට්ටමේදී වැදගත් නොවේ. මෙමගින් එම සමීකරණය කොළඹ දිස්ත්‍රික්කයට ඉතා හොඳට ගැලපෙන බව පෙන්නුම් කරයි.

එවිට සමීකරණය මෙසේ වේ; $c = a/y$ .... (3)

මෙහි ' a ' නියතයක් (අක්කරයක සාමාන්‍ය පිරිවැයෙහි නිමානයක් වන අතර එම නිමානය බර තැබූ සාමාන්‍යයකි) වන අතර අන්‍ය දිස්ත්‍රික්කවල උපයෝගී කර ගත් දත්තවලට මනාසේ ගැලපේ. මෙම සමීකරණයෙන් අක්ෂ දෙකටම සාරිශෝන්මුඛ වන වක්‍රයක් ඉදිරිපත් කෙරෙයි. මෙම සමීකරණය මත පිහිටා සටහන් VI-1 හි සියළුම ප්‍රදේශ සඳහා අක්කරයක අස්වැන්න සහ බුසලක නිෂ්පාදන පිරිවැය අතර ඇති සම්බන්ධතාවය දක්වා ඇත. නිෂ්පන්න කරන ලද වක්‍රයන් I සහ II හි දක්වා ඇත.

රූප සටහන් I

අක්කරයක අස්වැන්න සහ බුසලක පිරිවැය අතර ඇති සම්බන්ධතාවය

හම්බන්තොට



පොළොන්නරුව



ඇලහැර



රූප සටහන් 11

අක්කරයක අස්වැන්න සහ බුසලක පිරිවැය අතර ඇති සම්බන්ධතාවය



සටහන VI-I නිෂ්පාදන පිරිවැය සහ පලදාව අතර ඇති සම්බන්ධතාවය

ප්‍රදේශය	නිරීක්ෂණය කරන ලද වාර ගණන	අක්කරයක් සඳහා වූ අස්වැන්නෙහි නිරීක්ෂණය කරන ලද අගයන්ගේ අන්තරය	සුමටව ගැලපෙන වක්‍රය	r^2 1/	අක්කරයක සාමාන්‍ය අස්වැන්න 2/	බුසලක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය 3/
හම්බන්තොට	17	30.00 - 109.30	$c = 544.75/y$	0.947	53.30	10.22
පොළොන්නරුව	18	41.66 - 125.30	$c = 693.46/y$	0.907	77.57	8.94
ඇලහැර	12	72.00 - 107.00	$c = 762.69/y$	0.929	..	..
කුරුණෑගල	22	31.30 - 100.00	$c = 660.01/y$	0.914	40.90	16.14
මහනුවර	17	50.00 - 120.00	$c = 747.86/y$	0.914	66.52	11.24
කොළඹ	23	10.00 - 100.00	$c = 463.415/y + 0.0899y$	0.913	35.55	16.23

1. තීරණ සංගුණකය
2. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් 1972/73 මහ කන්නයේදී පවත්වන ලද ශස්‍ය කැපීමේ සමීක්ෂණයෙන් නිමානය ලබා ගන්නා ලදී.
3. මිල ගුණිතයෙන් නිෂ්පන්න කර ගන්නා ලද සාමාන්‍ය අස්වැන්නට අදාල අගය.

.. ලැබී නැත.

සටහන VI–2 බූසලක නිමානික පිරිවැය, බූසලක ලාභය සහ අක්කරයක් සඳහා වූ ලාභය

	හම්බන්තොට			පොළොන්නරුව			කුරුණෑගල			මහනුවර			කොළඹ		
	බූසලක නිමානිත පිරිවැය	බූසලක නිමානිත ලාභය	අක්කරයක නිමානිත ලාභය	බූසලක නිමානිත පිරිවැය	බූසලක නිමානිත ලාභය	අක්කරයක නිමානිත ලාභය	බූසලක නිමානිත පිරිවැය	බූසලක නිමානිත ලාභය	අක්කරයක නිමානිත ලාභය	බූසලක නිමානිත පිරිවැය	බූසලක නිමානිත ලාභය	අක්කරයක නිමානිත ලාභය	බූසලක නිමානිත පිරිවැය	බූසලක නිමානිත ලාභය	අක්කරයක නිමානිත ලාභය
20	27.24	-9.24	-184.80	34.67	-16.67	-333.40	33.00	-15.00	-300.00	37.39	-19.39	-387.80	24.97	-6.97	-139.40
25	21.79	-3.79	-94.75	27.74	- 9.47	-243.50	26.40	- 8.40	-210.00	29.91	-11.91	-297.75	20.78	-2.78	- 69.50
30	18.16	-0.16	- 4.80	23.12	- 5.12	-153.60	22.00	- 4.00	-120.00	24.93	- 6.93	-207.90	18.14	-0.14	- 4.20
35	15.56	2.44	85.40	19.81	- 1.81	-63.35	18.86	- 0.86	- 30.10	21.38	- 3.38	-118.30	16.39	-1.61	56.35
40	13.62	4.38	175.20	17.34	0.66	26.40	16.50	1.50	60.00	18.70	- 0.70	- 28.00	15.18	2.82	112.80
50	10.89	7.11	355.50	13.87	4.13	206.50	13.20	4.80	240.00	14.96	3.04	152.00	13.76	4.24	212.00
60	9.08	8.92	535.20	11.56	6.44	386.40	11.00	7.00	420.00	12.46	5.54	332.40	13.12	4.88	292.80
70	7.78	10.22	715.40	9.91	8.09	566.30	9.40	8.60	602.00	10.68	7.32	512.40	12.91	5.09	356.30
80	6.81	11.19	895.20	8.67	9.33	746.40	8.20	9.80	784.00	9.35	8.65	692.00	12.98	5.02	401.60
90	6.05	11.95	1075.50	7.71	10.29	926.10	7.30	10.70	963.00	8.31	9.69	872.10	13.24	4.76	428.40
100	5.45	12.55	1255.00	6.93	11.07	1107.00	6.60	11.40	1140.00	7.48	10.52	1052.00	13.62	4.38	438.00
110	4.95	13.05	1435.50	6.30	11.70	1287.00	6.00	12.00	1320.00	6.80	11.20	1232.00	14.10	3.90	429.00
120	4.54	13.46	1615.20	5.78	12.22	1466.20	5.50	12.50	1500.00	6.23	11.77	1412.40	14.65	3.35	402.00

1. ඇලහැර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති නිසාත් මෙම අධ්‍යයනයෙහි නිරීක්ෂණය කරන ලද අක්කරයක අස්වැන්නෙහි අගයන්හී පරතර පටු නිසාත් මෙම ප්‍රදේශය සම්බන්ධයෙන් වෙනම නිමානයක් නොකරන ලදී.

අධ්‍යයනය කරන ලද කාල පරිච්ඡේදයෙහි පැවති වී බුසලක සහතික මිල වූ රු. 18.00 වීකුණුම් මිල වන විට බුසලක නිෂ්පාදන පිරිවැය රට සමාන වන්නේ නම් ලැබෙන අස්වැන්න පහත දක්වා ඇත:

අධ්‍යයන ප්‍රදේශය			බුසලක නිෂ්පාදන පිරිවැය රු. 18/- ක් වනවිට රට සමානුපාත වන අස්වැන්න
හම්බන්තොට	..	..	30.26
පොළොන්නරුව	..	..	38.53
ඇලහැර	..	..	42.37
කුරුණෑගල	..	..	36.67
මහනුවර	..	..	41.55
කොළඹ	..	..	30.44

බුසලක් රු. 18/- කට මිල කළ විට වී වලින් යම් ලාභයක් ලබා ගැනීමට නම් අක්කරයක ලැබෙන අස්වැන්න හම්බන්තොට සහ කොළඹ දිස්ත්‍රික්කයෙහි අක්කරයකට බුසල් 30 කට වඩා ලබා ගත යුතු අතර, කුරුණෑගල හා මහනුවර දිස්ත්‍රික්කයන්හි බුසල් 37 කට වඩා ලබා ගත යුතු වෙයි. පොළොන්නරුව සහ ඇලහැර යන ප්‍රදේශවල පිළිවෙලින් බුසල් 38 සහ 42 කට වැඩියෙන් ලැබෙන විට නිෂ්පාදන පිරිවැය සහතික මිල සමඟ සමාන වේ. නමුත් මෙම නිමානික අස්වැන්න ප්‍රමාණය නිරීක්ෂිත අගයන් අක්කරයක් තුළ පතිත නොවන නිසා මෙම අගැයීම් කෙරෙහි වැඩි විශ්වාසයක් තැබීමට නොහැකිය. පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි සහ ඇලහැර ප්‍රක්ෂයෙහි මූලික වශයෙන් සහතික ජල සැපයීම් තත්වය හේතුකොටගෙන අක්කරයක සාමාන්‍ය අස්වැන්න ප්‍රමාණය ඉහළ නිසා මෙම ප්‍රදේශ දෙකෙහි ආර්ථික වශයෙන් වැදගත් නොවූ අස්වැන්නක් ලබා ගන්නා ගොවීන්ගේ සමානුපාතය නොසලකා හැරීම යථාර්තවත් යයි සැළකිය හැකිය. කොළඹ සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි අක්කරයක සාමාන්‍ය අස්වැන්න ප්‍රමාණය අඩු අතර බුසලක **සාමාන්‍ය** නිෂ්පාදන පිරිවැය අධ්‍යයන කළ කාලයෙහි පැවති සහතික මිලට සෑහෙන පමණ සමාන විය. එම සංඛ්‍යාවන් පිළිවෙලින් රු. 16.23 ක් සහ රු. 16.14 ක් විය. (සටහන් V-1) කොළඹ සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි විවිධ භෞතික සහ පරිසරය ආශ්‍රිත සීමාවන් මෙන්ම සාමාන්‍ය අඩු අස්වැන්න ප්‍රමාණයන් සළකා බලනවිට ගොවීන්ගෙන් සෑහෙන කොටසක් සාමාන්‍යයෙන් අක්කරයකට බුසල් 30 කට අඩු ප්‍රමාණයක් අස්වැන්න ලබා ගන්නා බව සිතිය හැක. නියැදි විශාලත්වය නොසෑහීමත් එහි ඇති සසම්භාවී නොවන ස්වරූපයත් නිසා ආර්ථික වශයෙන් අසාර්ථක අස්වැන්නක් ලබා ගන්නා ගොවීන්ගේ ප්‍රතිශතයක නිගමනය කිරීම අසීරුය.

මෙම පිරිවැය ශ්‍රිතයන් මත අක්කරයක් සඳහා ලබා ගත් විවිධ අස්වැන්න ප්‍රමාණයන්ට අනුරූප බුසලක නිෂ්පාදන පිරිවැය බුසලක සහ අක්කරයක ලාභ ප්‍රමාණයන් තක්සේරු කොට එම තක්සේරු ප්‍රමාණය සටහන් VI-2 හි දක්වා ඇත.

මෙම අධ්‍යයනයේදී නිරීක්ෂණය කරන ලද අස්වැන්න අගයන් අක්කරයකට බුසල් 30 – 40 සිට බුසල් 100–120 දක්වා කොළඹ හැර අන්‍ය දිස්ත්‍රික්කවලදී විචලනය වූ බව පෙනේ. මෙසේ මෙම දිස්ත්‍රික්කවලදී අක්කරයකට බුසල් 20 සිට 30 දක්වා වෙනස් වූ ප්‍රමාණයන්ට අනුරූපව V–2 හි දක්වා ඇති අදාළ පිරිවැය හා ලාභ ප්‍රමාණයන් මහත් ප්‍රවේශමින් සැළකිය යුතුය. මෙම තොරතුරු පරීක්ෂා කර බැලීමේදී බුසලකට ලැබුණු ලාභ ප්‍රමාණ අස්වැන්න අඩු ප්‍රදේශවල සෑහෙන පමණ වෙනස් වූ අතර අක්කරයකට බුසල් 70 කට වැඩිය ලැබෙන කොළඹ හැර අන්‍ය ප්‍රදේශවල එම ලාභ ප්‍රමාණවල යම් ප්‍රමාණයක ඒකීය තාවයක් දක්නට ලැබේ. කෙසේ වෙතත් කොළඹ හැර අන්‍ය හදාරන ලද ප්‍රදේශවල අස්වැන්න කෙතරම් වුවද අක්කර යකින් ලැබෙන ලාභ ප්‍රමාණයන් ඒ ඒ ප්‍රදේශ අතර යම් නියත ප්‍රමාණයකින් වෙනස් වන බව පෙනේ.

කොළඹ දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් වක්‍රය $=463.415/y + 0.0899y$ මනා ලෙස ගැලපෙන අතර අක්කරයකට බුසල් 70 ක් පමණ ලැබෙන විට බුසලක පිරිවැය අවම වන බව පෙන්නුම් කරයි. අක්කරයක ලාභය අක්කරයකට අස්වැන්න බුසල් 100 වන විට උපරිම වෙයි. අනික් දිස්ත්‍රික්කයන් හා සසඳන විට මෙම දිස්ත්‍රික්කයෙහි අස්වැන්න බුසල් 50 ඉක්මවන අවස්ථා වලදී අක්කරයක සහ බුසලක ලාභය අඩු බව පෙනේ.

නියැදියෙහි විශාලත්වය ප්‍රමාණවත් නොවීමත් එහි සසම්භාවී ස්වරූපයක් නොවීමත් නිසා අපගේ විශ්ලේෂණයෙහි ඇති සීමාවන් මෙහිදී සඳහන් කිරීම අත්‍යවශ්‍ය වෙයි. මේ නිසා මෙම විශ්ලේෂණයෙහි ප්‍රතිපල විවරණය කිරීමේදී මහත්සේ පරීක්ෂාකාරී වීම අත්‍යවශ්‍ය වෙයි.

කෘෂිකාර්මික භෝගයන්හි නිෂ්පාදන පිරිවැය අනුව මිල තීරණය කිරීම ප්‍රශ්න රාශියක් මතු කරයි. මෙහිදී විසඳිය යුතු මූලික ප්‍රශ්නයක් වන්නේ අහස් වැසි තත්වයන් යටතේ ගොවිතැන් කරන අන්තරී කලාපීය සහ තෙත් කලාපීය ප්‍රදේශවල සුළු නිෂ්පාදකයන්ට මෙන්ම වියළි කලාපයේ ජල සම්පාදන තත්වයන් යටතේ සාපේක්ෂ වශයෙන් විශාල කුඹුරු ඉඩම්වල වගා කටයුතු කරන නිෂ්පාදකයන්ට සාධාරණ මිළක් සඳහා සහතික මිලක් තීරණය කිරීම හුදෙක් ගොවීන් විසින් දරන ලද නිෂ්පාදන පිරිවැය ප්‍රමාණයන් සළකා බැලීමකට වඩා පුළුල් මට්ටමක් කරුණු විග්‍රහ කිරීමෙන් කළ යුතු කාර්යයකි. කෙසේ වෙතත් රජය මගින් නියම කරන ලද වී මිළ, ගොවීන්ට තමන් දරන ලද වියදම් පියවා ගැනීමට මෙන්ම නිෂ්පාදන වැඩි කිරීමට සෑහෙන උනන්දුවක් ඇති කරවන සුළු ලාභයක් ද ලබා දෙන බව මෙහිදී සඳහන් කිරීම ඉතා වැදගත්ය. ගොවීන්, විශේෂයෙන් කුඩා කුඹුරු වගා කරන ගොවීන් උනන්දු කිරීමටත් ඔවුන් දැරූ නිෂ්පාදන පිරිවැය ප්‍රමාණයන් පියවා ගැනීමටත් හැකි වන ලෙස ප්‍රතිපත්ති තීරණය කිරීම සංකීර්ණ කාර්යයකි. හුදෙක් සරල පිරිවැය ශ්‍රිතයක් නිමානය කිරීමකින් පමණක් එවැන්නක් කිරීමට උත්සාහ කිරීම ඊටත් වඩා අසීරුය.

මිල කිරීමේ පිළිවෙල

විවිධ කරුණුවල මිල නියම කිරීමේදී පහත සඳහන් පිළිවෙල යොදා ගැනින:

I. ශ්‍රමය

(අ) කුලී ශ්‍රමය – කුලී ශ්‍රමයට ගෙවූ මිල ගණනය කිරීමේදී ගොවීන් විසින් ඇත්තෙන්ම දරන ලද කුලී ගාස්තු සලකන ලදී. එම වියදම්වලට කුලී ශ්‍රමිකයන් සඳහා ආහාර පාන සැපයීම පිණිස වාරිකා තබා ගන්නාවූ, ගොවීන්ට දැරීමට සිදු වූ වියදම් ද එකතු කරන ලදී.

(ආ) අත්තම් – මේ ක්‍රමයට ගොවිතැන් කළ අවස්ථාවලදී එම ප්‍රදේශවල කුලී ශ්‍රමිකයන්ට ගෙවන සාමාන්‍ය වැටුප් ප්‍රමාණයන් මිල ගණනය කිරීමේදී යොදා ගන්නා ලදී. මෙම අවස්ථාවලදී ද ආහාර පාන සඳහා ගොවීන්ට දරන්නට සිදු වූ වියදම් තක්සේරු කොට පිරිවැයට එකතු කරන ලදී.

(ඇ) පවුල – පවුලේ ශ්‍රමය මිල කිරීමේදී ආවස්ථික වියදම් පිළිබඳ මූල ධර්මය යොදා ගනු නො ලැබීන. ඇත්තෙන්ම ශ්‍රී ලංකාවේ පිටිසර පළාත්වල පවුල්වල සාමාජිකයන්ගේ ශ්‍රමයෙහි ආවස්ථික වියදමක් නැති තරම්ය. යොදා ගන්නා ලද පවුල් ශ්‍රමය මිල කිරීමේදී අදාළ ගොවීන් විසින් කුලී ශ්‍රමිකයන්ට ගෙවන ලද වැටුප් පරිමාණයන් යොදා ගන්නා ලදී. කෙසේ වෙතත් මෙම ශීර්ෂය යටතේ පවුලේ ශ්‍රමිකයන් විසින් පරිභෝජනය කරන ලද ආහාර පානවල වටිනාකම නොසලකා හැරින; වී වගාවෙහි යෙදුන හෝ නොයෙදුන ද එම වියදම් පවුලේ ශ්‍රමිකයන් විසින් දරනු ලබන හෙයිනි.

II. මී හරක්

මී හරක් කුලියට ගත් අවස්ථාවලදී ඒ සඳහා දරන ලද නියම වියදම් ගණනය කරන ලදී. ගොවියාටම අයිති මී හරක් වී වගා කටයුතුවලට යොදා ගත් විට එම ප්‍රදේශයෙහි අන්‍ය ගොවියන් මී හරක් කුලියට ගැනීමේදී ගෙවන සාමාන්‍ය ගාස්තු ප්‍රමාණය වියදම් ගණනය කිරීමට යොදා ගන්නා ලදී.

III. ට්‍රැක්ටර් යන්ත්‍ර

ට්‍රැක්ටර් යන්ත්‍ර කුලියට ගත් අවස්ථාවලදී ඒ සඳහා ඒ ඒ ගොවීන් ගෙවන ලද ගාස්තු වියදම් ලෙස සලකන ලදී. ට්‍රැක්ටර් හිමි ගොවීන් එම යන්ත්‍ර භාවිතා කරන විට ප්‍රාදේශීය ගාස්තු පරිමාන අනුව එම වියදම් ගණන් බලන ලදී.

IV. භාවිතා කළ ද්‍රව්‍ය

බීජ වී, පොහොර, රසායනික ද්‍රව්‍ය සහ ගෝනි වැනි ද්‍රව්‍යයන් සඳහා වූ වියදම් ගණනය කිරීමේදී එම ද්‍රව්‍යයන් සැපයුයේ ගොවියා ද ඉඩම් හිමියාද යන්න නොසලකා දරන ලද නියම වියදම් සලකන ලදී.

V. බිම් කුලිය

චාරිත්‍ර තබා ගත් ගොවියා අඳ ගොවියකු වී නම් ප්‍රදේශයෙහි පවතින අඳය ගෙවීමේ අනුපාත රටාව අනුව බිම් කුලිය වියදම් ලෙස ගණනය කරන ලදී. අක්කර බද්ද ගෙවන අවස්ථාවලදී එම මුදල ද වියදමට ඇතුළත් කරන ලදී.

VI. ද්‍රව්‍ය වශයෙන් කළ ගෙවීම්

ශ්‍රමිකයන්ට, ට්‍රැක්ටර් හිමියන්ට සහ ඉඩම් හිමියන්ට යනාදී වශයෙන් විවිධ පුද්ගලයන්ට ද්‍රව්‍ය වශයෙන් කරන ලද ගෙවීම්වල මිළ ගණනය කිරීමට වීවල සහතික මිළ පදනම ලෙස යොදා ගන්නා ලදී.

VII. ප්‍රවාහනය

යෙදවුම් ගොවිපොළට ගෙන යාමටත් නිමැවුම් ගොවිපල වලින් ගෙන ඒමටත් දරන ලද ප්‍රවාහන වියදම් මෙම ගණනයට ඇතුළත් කරන ලදී.

වගා පිළිවෙත් පිළිබඳ සවිස්තර සටහන්

මෙම වගා ගත කිරීමේදී ක්ෂේත්‍ර කාර්යයන් කොටස් අටකට වර්ග කර ඇත. එනම් :-

1. බිම සකස් කිරීම
2. තවාන
3. පැල සිටුවීම
4. ජලය සැපයීම
5. මතුපිට පොහොර යෙදීම - කෘමි හා වල් පැලෑටි මර්දනය
6. අස්වැන්න කැපීම
7. සකස් කිරීම
8. ප්‍රවාහනය

එක් එක් කොටසෙහි අඩංගු කාර්යයන් පිළිබඳ විස්තර පහත දැක්වේ :-

1. තවන් කිරීම ඇතුළු බිම සකස් කිරීම

ජල මාර්ග පිරිසිදු කිරීම, සී සෑම හෝ උදලු ගෑම, රෛන්ද්‍රීය පොහොර යෙදීම, බිම් සකස් කිරීමට ජලය සැපයීම, පෝරු ගෑම, මඩ කිරීම, බිම් පිරිසිදු කිරීම සහ සමතලා කිරීම යනාදි කාර්යයන් බිම සකස් කිරීමට ඇතුළත් වෙයි.

2. තවාන් කිරීම

පිරිසිදු කිරීම හා මුල් ඇදීම ඇතුළු බීජ වී සකස් කර ගැනීම, තවානේ බීජ සිටුවීම, තවාන පොහොර කිරීම යනාදි කාර්යයන් තවන් කිරීමට ඇතුළත් වෙයි.

3. පැල සිටුවීම

වී ඉසීම-වැපිරීම හෝ/සහ පැල සිටුවීම

වී ඉසීම - කුඹුර අවසාන සමතලා කිරීම, මඩ පොහොර යෙදීම, වැපිරීම යන කාර්යයන්.

පැල සිටුවීම - තවානේ පැල ගලවා සිටුවීම, කුඹුරට ජලය සැපයීම සහ අවසාන සමතලා කිරීම, මඩ පොහොර යෙදීම සහ පැල සිටුවීම.

4. ජලය සැපයීම

පැල සිටුවීමේ සිට අස්වැන්න කපා ගැනීම දක්වා උපයෝගී කර ගත් ශ්‍රමය පමණක් මෙහිදී ජලය සැපයීමේ කාර්යයට ඇතුළත් වෙයි.

5. <u>මතුපිට පෝර යෙදීම – කෘමි හා වල් පැළෑටි මර්දනය</u>

මතුපිට පෝර යෙදීම, අත් සහ යාන්ත්‍රික වල් නෙලීම, පැළෑටි නාශක සහ/හෝ දිලීර නාශකයන් ඉසීම යනාදියයි.

6. <u>අස්වැන්න කපා ගැනීම</u>

ගොයම් කැපීම, මිටි බැඳීම, ගොයම් මිටි කමතට ගෙන ඒම සහ කමත අසල ගොඩ ගැසීම යනාදියයි.

7. <u>සකස් කිරීම</u>

මීට පහත සඳහන් කාර්යයන් ඇතුළත් වෙයි:

කමත අළුත්වැඩියා කිරීම හා පිරිසිදු කිරීම, ගොයම් මිටි කැඩීම, ගොයම් කමතේ එලීම, පෙලීම, ඇසිරීම සහ වියලීම යන කාර්යයන්ය.

8. <u>ප්‍රවාහණය</u>

කමතේ සිට නිවසට සහ/හෝ සමුපකාරයට පැහැවී ප්‍රවාහනය කිරීම මීට ඇතුළත් වෙයි.

උප ලේඛන සටහන - I අක්කරයක් සඳහා මෙහෙයුම්

සියළුම වාර්තා තබා ගත්

සටහන්: කු - කුලී ශ්‍රමය

අ - අත්තම් ශ්‍රමය

ප - පවුල් ශ්‍රමය

	හම්බන්තොට				පොළොන්නරුව			
	කු	අ	ප	මුළු	කු	අ	ප	මුළු
ගොවිපලවල් ගණන				14				18
මහ කන්නයේ වී වගා කරන ලද මුළු භූමි ප්‍රමාණය				67.34				71.46
ගොවිපලක මහ කන්නයේදී වී වගා කළ ලද භූමි ප්‍රමාණය				4.81				3.97
බිම සකස් කිරීම	10.1	-	1.6	11.7	8.5	-	1.8	10.3
%				(22.5)				(14.8)
තවාන	1.0	-	0.5	1.5	0.9	-	0.5	1.4
%				(2.9)				(2.0)
ජල සැපයුම	0.5	-	2.2	2.7	2.0	-	6.2	8.2
%				(5.2)				(11.8)
පැල සිටුවීම	13.9	-	0.3	14.2	16.0	-	1.6	17.6
%				(27.3)				(25.4)
පශ්චාත් සැලකීම	4.2	-	1.4	5.6	2.1	-	1.7	3.8
%				(10.7)				(5.5)
අස්වැන්න කැපීම	9.1	-	0.5	9.6	13.4	-	1.8	15.2
%				(18.4)				(21.9)
වී පෑහීම	5.6	-	0.2	5.8	9.6	-	1.7	11.3
				(11.1)				(16.3)
පරිවාහනය	0.5	-	0.5	1.0	1.3	-	0.3	1.6
				(1.9)				(2.3)
මුළු	44.9	-	7.2	52.1	53.8	-	15.6	69.4
%				(100.0)				(100.0)

කාරක වශයෙන් ශ්‍රම ව්‍යාප්තිය
ගොවිපලවල සාමාන්‍යය

ඇලහැර				කුරුණෑගල				මහනුවර				කොළඹ			
කු	අ	ප	මුළු	කු	අ	ප	මුළු	කු	අ	ප	මුළු	කු	අ	ප	මුළු
			12				25				21				24
			47.76				49.00				25.83				26.64
			3.98				1.96				1.23				1.11
5.6	0.1	4.9	10.6 (15.7)	8.1	0.3	2.8	11.2 (17.1)	12.0	2.0	6.3	20.3 (21.1)	9.2	0.7	4.5	14.4 (23.4)
0.5	-	1.5	2.0 (3.0)	1.1	-	0.3	1.4 (2.1)	3.5	-	1.7	5.2 (5.4)	1.5	-	0.7	2.2 (3.6)
0.5	-	7.4	7.9 (11.7)	1.6	-	3.4	5.0 (7.6)	0.6	-	7.0	7.6 (7.9)	0.5	-	3.5	4.0 (6.5)
11.2	0.1	3.5	14.8 (21.9)	6.2	0.8	2.5	9.5 (14.5)	15.4	2.9	2.4	20.7 (21.5)	4.8	1.8	2.8	9.4 (15.3)
1.9	-	3.0	4.9 (7.2)	5.3	-	4.6	9.9 (15.1)	6.9	0.1	3.6	10.6 (11.0)	3.5	0.3	2.7	6.5 (10.6)
14.7	-	1.0	15.7 (23.1)	13.3	2.7	2.8	18.8 (28.6)	9.4	4.6	2.5	16.5 (17.1)	10.1	2.2	3.5	15.8 (25.6)
7.8	0.2	2.4	10.4 (15.4)	4.5	2.1	1.7	8.3 (12.7)	8.0	1.9	3.8	13.7 (14.2)	4.3	1.0	2.5	7.8 (12.6)
0.5	-	0.9	1.4 (2.0)	1.0	-	0.5	1.5 (2.3)	1.0	-	0.7	1.7 (1.8)	0.6	0.1	0.8	1.5 (2.4)
42.7	0.4	24.6	67.7 (100.0)	41.1	5.9	18.6	65.6 (100.0)	56.8	11.5	28.0	96.3 (100.0)	34.5	6.1	21.0	61.6 (100.0)

උප ලේඛන සටහන් 2. ගොවීන්ගේ ඉඩම් භුක්ති තත්වයන් අනුව

	හම්බන්තොට		කුරුණෑගල	
	ඉඩම් හිමි ගොවීන්	අඳ ගොවීන්	ඉඩම් හිමි ගොවීන්	අඳ ගොවීන්
ගොවිපලවල් ගණන	4	10	22	3
වගා කළ මුළු භූමි ප්‍රමාණය (අක්කර)	23.24	44.00	43.56	5.49
ගොවිපලක වගා කරන ලද සාමාන්‍ය භූමි ප්‍රමාණය (අක්කර)	5.81	4.40	1.98	1.33
උපයෝගී කර ගන්නා ලද මිනිස් ශ්‍රම ගණන:				
කුලී	42.3	46.3	43.2	24.3
අත්තන්	-	-	4.8	15.6
පවුල්	5.2	8.3	16.5	35.6
මුළු	47.5	54.6	64.5	75.5
අක්කරයක් සඳහා මෙහෙයුම් කාරක වශයෙන් උපයෝගී කර ගත් ශ්‍රම ව්‍යාප්තිය මිනිස් දින වලින්				
බිම සකස් කිරීම	12.6	9.6	11.3	9.5
%	(26.5)	(17.6)	(17.5)	(12.6)
තවාන	1.5	1.5	2.0	0.7
%	(3.2)	(2.8)	(3.1)	(0.9)
ජල සැපයුම	2.0	3.6	6.0	6.8
%	(4.2)	(6.6)	(9.3)	(9.0)
පැල සිටුවීම	11.8	15.5	12.3	17.6
%	(24.8)	(28.4)	(19.1)	(23.3)
මතුපිට පෝර යෙදීම හා කෘමි මර්දනය	2.9	6.0	5.0	8.8
%	(6.1)	(11.0)	(7.8)	(11.7)
අස්වැන්න නෙළීම	9.9	12.1	18.4	19.9
%	(20.8)	(22.2)	(28.6)	(26.3)
වී පෑගීම	5.4	5.5	8.0	11.0
%	(11.4)	(10.0)	(12.3)	(14.6)
ප්‍රවාහනය	1.4	0.8	1.5	1.2
%	(3.0)	(1.4)	(2.3)	(1.6)
මුළු	47.5	54.6	64.5	75.5
%	(100.0)	(100.0)	(100.0)	(100.0)

අක්කරයක ක්ෂේත්‍ර කාර්යයන් සඳහා උපයෝගී කර ගන්නා ලද මිනිස් දින ගණන 1972/73 මහ

මහනුවර		කොළඹ	
ඉඩම් හිමි ගොවීන්	අඳ ගොවීන්	ඉඩම් හිමි ගොවීන්	අඳ ගොවීන්
14	7	16	8
20.02	5.81	13.44	13.12
1.43	0.83	0.84	1.64
59.9	46.0	41.1	27.7
7.6	24.3	7.3	4.8
24.2	41.3	21.3	19.8
91.7	111.6	69.7	52.3
16.5	15.8	12.6	9.7
(18.0)	(14.2)	(18.1)	(18.6)
6.0	9.2	4.4	-
(6.5)	(8.2)	(6.3)	(-)
8.2	15.8	3.6	4.4
(8.9)	(14.2)	(5.2)	(8.4)
20.5	28.3	14.3	10.6
(22.4)	(25.4)	(20.5)	(20.3)
8.0	5.8	7.5	4.5
(8.7)	(5.2)	(10.8)	(8.6)
17.7	19.2	15.9	15.8
(19.4)	(17.1)	(22.8)	(30.3)
13.3	15.2	9.8	5.8
(14.5)	(13.6)	(14.0)	(11.1)
1.5	2.3	1.6	1.4
(1.6)	(2.1)	(2.3)	(2.7)
91.7	111.6	69.7	52.2
(100.0)	(100.0)	(100.0)	(100.0)

9183

රූප සටහන 3